# පුරවැසි අධ්‍යාපනය

## 8 ශ්‍රේණිය

### ගුරු මාර්ගෝපදේශය

(2017 සිට ක්‍රියාත්මක වේ)




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

www.nie.lk

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය
## 8 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල: info@nie.lk

පුරවැසි අධ්‍යාපනය
8 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : nifo@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර◌ වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී

පර්යේෂණ වලින් අනාවරණය වූ කරුණු ද◌ අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම◌ විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම◌ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකව නිරත වීම◌ පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ◌ නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවයෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රම වේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයෙහි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙ හි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය** |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා. අ. ආයතනය |

**ලේඛක මණ්ඩලය (බාහිර)**

| | |
|---|---|
| ආචාර්ය ශාමින්ද වනසිංහ මයා | කථිකාචාර්ය, අධ්‍යාපන පීඨය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| සී.එස් ජයසිංහ මයා | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික), හොරණ |
| පී.ඩී. සෝමාවතී මිය | ගුරු උපදේශිකා (විශ්‍රාමික), බුලත්සිංහල |
| එන්.ඩී.සී. ජයාංගනි මිය | නියෝජ්‍ය විදුහල්පති<br>මහරගම ම.ම.වි., මහරගම |
| එම්.කේ කිංස්ලි ප්‍රියන්ත මයා | කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දුව, ගාල්ල |
| එම්.එච්.එම්. යාකුත් මයා | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| එච්.පී. සුසිල් සිරිසේන මයා | කථිකාචාර්ය<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර මයා | ගුරු සේවය<br>පොලේගොඩ ම.වි, මහගම |

**ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)**

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්.යූ.අයි.කේ ද සිල්වා මිය | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| ශ්‍රීනාත් ගණේවත්ත මයා | 179, කජුගහවත්ත, ගොතටුව, අංගොඩ |

**පිටකවර නිර්මාණය**

| | |
|---|---|
| රවීන්ද්‍ර තේනුවර මයා | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විවිධ සහාය**

| | |
|---|---|
| ඒ. එල්. එස්. පී. අතපත්තු මෙය | කළමනාකරණ සහකාර, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ජී. එස්. ඩී. ප්‍රනාන්දු මයා | කාර්යාල ආධාරක, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

පුරවැසි අධ්‍යාපනය 8 ශ්‍රේණියට අදාළ මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීමේ දී එක් එක් නිපුණතාවට, නිපුණතා මට්ටමට අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාක්ෂාත් කරගත හැකි පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කිරීමේ දී ආවරණය කළ යුතු විෂය කරුණු අවශ්‍ය උදාහරණ සහිත ව දක්වා ඇත. ගුරු මාර්ගෝපදේශය භාවිතයට ගැනීමේ දී එක් එක් මාතෘකාවට සමගාමී ව පෙළ පොතෙහි ඇතුළත් කර ඇති කරුණු හා ක්‍රියාකාරකම් ද සැලකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි ඇතුළත් කර ඇති ගුණාත්මක යෙදවුම් උදාහරණ වන අතර අවශ්‍ය පරිදි ඒවා වෙනස් කර ගැනීමේ නිදහස තිබේ.

මෙම විෂයයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ දී මෙහි ඇතුළත් විෂය අන්තර්ගතය අර්ථාන්විත ව අධ්‍යයනය කිරීමට ඉඩ සලසා දීම ගුරු කාර්යභාරය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ.

අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් විෂය කරුණු ආවරණය කිරීම කෙරෙහි ගුරුභවතාගේ අවධානය යොමු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමු. මෙම ගුරු මාර්ගෝපදේශය සම්බන්ධ සංවර්ධනාත්මක යෝජනා වෙතොත් අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

ව්‍යාපෘති කමිටුව

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශය | viii-xxxix |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | |
| **8.1 පොදු සේවා** | **2 12** |
| **8.2 ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය** | **13 28** |
| **8.3 බහුසංස්කෘතික ජන සමාජය** | **29 37** |
| **8.4 කාලීන ගැටලු** | **38 54** |
| **8.5 ගැටලු විසඳීම හා තීරණ ගැනීම** | **55 60** |
| **8.6 වැඩ ලෝකය** | **61 80** |

# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 8 ශ්‍රේණිය

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

# හැඳින්වීම

පුරවැසි අධ්‍යාපනය විෂයය පාසල් පද්ධතියට හඳුන්වා දීමේ ප්‍රධානතම පරමාර්ථය වන්නේ **ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම යි.** සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි විවිධ ජන වර්ග ලෙස හෝ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික/ ක්‍රිස්තියානි ආදි වශයෙන් ආගමික කොටස් ලෙස හෝ බෙදී වෙන් වී සිටිනවාට වඩා සියලු ජන වර්ග, ආගමික කොටස් කිසිඳු භේදයකින් තොර ව ශ්‍රී ලංකා මාතාවගේ එක ම දූ පුතුන් ලෙස සමගියෙන්, සහජීවනයෙන්, සමානාත්මතාවෙන්, සාමකාමී ව ජීවත් වනු දැකීම ''සාමය'' අගයන සැමගේ ද ප්‍රාර්ථනාවයි. තිරසර සාමය ළඟා කර ගැනීම සඳහා "ස්වකීය පවුලේ සිට විශ්ව ව්‍යාප්ත පවුල තෙක්" යන තේමාව යටතේ ප්‍රධාන විෂය අරමුණු 12ක් හා ප්‍රධාන විෂය නිපුණතා 20ක් යටතේ පුරවැසි අධ්‍යාපනය විෂය 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක වේ.

6 - 9 ශ්‍රේණි සඳහා අනිවාර්ය විෂයයක් ලෙසත්, 10 - 11 ශ්‍රේණි සඳහා පළමු වන කාණ්ඩයේ විෂයයක් ලෙසත් ක්‍රියාත්මක වන පුරවැසි අධ්‍යාපනය විෂයයට අදාළ 8 ශ්‍රේණියේ විෂය නිර්දේශය මේ සමග ඉදිරිපත් කෙරේ.

පොදු සේවා, ප්‍රජාතන්ත්‍රවාදි ජන සමාජය, බහුසංස්කෘතික ජන සමාජය, කාලීන ගැටලු, ගැටලු විසඳීම හා තීරණ ගැනීම සහ වැඩ ලෝකය යන ප්‍රධාන මාතෘකා 06ක් ඔස්සේ ජාතියේ දූපුතුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙම ශ්‍රේණියේ දී අපේක්ෂා කෙරේ. 6 ශ්‍රේණියේ සිට විවිධ මාතෘකා ඔස්සේ පුරවැසි දැනුම, පුරවැසි ආකල්ප, පුරවැසි කුසලතා සංවර්ධනය කර ගනිමින් පුරවැසි ක්‍රියාකාරකම්වල යෙදෙන දූපුතුන් තව දුරටත් ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවට මෙන් ම ලෝක සමාජයට ගැළපෙන යහපත් පුරවැසියන් නිර්මාණය කිරීමේ දී 8 ශ්‍රේණියට අදාළ නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය මෙන් ම ඉගෙනුම් පල ද ඉතා වැදගත් බව අවධාරණය කරමු.

සමගිය, සහජීවනය, සංහිඳියාව මගින් ශ්‍රී ලංකා මාතාවට තිරසර සාමයක් ළඟා කර ගැනීමට යන ගමනේ දී පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් ඉටු කළ හැකි සමාජ මෙහෙවර අතිවිශාල බව ද මෙහි දී සිහිපත් කරමු. ඒ කෙරෙහි ඔබගේ අවධානය යොමු වනු ඇතැයි ද, පූර්ණ සහයෝගය හා දායකත්වය ලැබෙනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

ii. තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(iii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

## පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනඟාගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමඟ එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංග හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැඟීම

07. ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථික න්‍යාය හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩ නැඟීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනඟාගැනීම මඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

# ජාතික පොදු අරමුණු සහ විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව

| විෂය නිර්දේශයේ අරමුණු | | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | i | ii | iii | iv | v | vi | vii | viii |
| 01. | තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනඟාගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | √ | | | | | | |
| 02. | මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම | | | | | √ | | | |
| 03. | සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමඟ එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | | | | | | | √ |
| 04. | නිරතුරු ව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | | | | | | √ | |
| 05. | බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංගවලින් හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම | √ | | | | | | | |
| 06. | ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැඟීම | | | √ | | | | | |
| 07. | ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම | | | | | | | √ | |
| 08. | දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම | | | | | | | | √ |
| 09. | විවිධ ආර්ථික න්‍යාය හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම | | | | | | √ | | |
| 10. | අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැඟීම | | | | | √ | | | |
| 11. | ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම | √ | | | | | | | |
| 12. | දැරිය හැකි ජීවන රටාවක් ගොඩනඟාගැනීම මඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම | | | | √ | | | | |

## පුරවැසි අධ්‍යාපනය 8 ශ්‍රේණිය විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| වාරය | නිපුණතාව | නිපුණතා මට්ටම් | කාලච්ඡේද ගණන | නිපුණතා මට්ටම් ගණන |
|---|---|---|---|---|
| පළමු වන වාරය | 8.1 | 8.1.1, 8.1.2, 8.1.3, 8.1.4 | 10 | 04 |
| | 8.2 | 8.2.1, 8.2.2, 8.2.3, 8.2.4, 8.2.5 | 10 | 05 |
| දෙවන වාරය | 8.3 | 8.3.1, 8.3.2, 8.3.3 | 10 | 03 |
| | 8.4 | 8.4.1, 8.4.2, 8.4.3, 8.4.4, 8.4.5, 8.4.6 | 10 | 06 |
| තෙවන වාරය | 8.5 | 8.5.1, 8.5.2 | 06 | 02 |
| | 8.6 | 8.6.1, 8.6.2, 8.6.3, 8.6.4, 8.6.5, 8.6.6, 8.6.7, 8.6.8, 8.6.9, 8.6.10 | 14 | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **පොදු සේවා**<br><br>8.1<br>ජන ජීවිතයේ යහපත පිණිස පවත්නා පොදු සේවා ඵලදායි ව හා නිවැරදි ව භාවිත කරයි. | 8.1.1<br>පොදු සේවා හඳුනා ගෙන එහි අවශ්‍යතා හා කාලීන වැදගත්කම විමර්ශනය කරයි. | • පොදු සේවා<br>- හැඳින්වීම<br>- අවශ්‍යතා හා විකාශනය<br>- කාලීන වැදගත්කම<br>- පොදු සේවාවල ලක්ෂණ | • පොදු සේවා හඳුන්වයි.<br>• පොදු සේවාවල අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• පොදු සේවාවල ආරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.<br>• පොදු සේවාවල කාලීන වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.<br>• පොදු සේවාවල පොදු ලක්ෂණ පැහැදිලි කරයි. | 02 |
| | 8.1.2<br>පොදු සේවා සපයන ආයතන හඳුනා ගෙන ජන ජීවිතය යහපත් කර ගැනීමට යොදා ගනියි. | • අප ප්‍රදේශයේ පොදු සේවා<br>- ජල සම්පාදනය<br>- සෞඛ්‍යය<br>- ප්‍රවාහණය<br>- විදුලිය<br>- පණිවිඩ හුවමාරුව<br>- ආරක්ෂක සේවා<br>- අධ්‍යාපනය<br>- තැපැල<br>- සමුපකාරය | • තම ප්‍රදේශයට සැපයෙන පොදු සේවා නම් කරයි.<br>• පොදු සේවා සපයන ආයතනවල හා ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ කාර්යභාරය පැහැදිලි කරයි.<br>• රජය මඟින් සැපයෙන වෙනත් පොදු සේවා පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• පොදු සේවා සපයන වෙනත් සංවිධානවලට නිදසුන් දක්වයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • පොදු සේවා සපයන ආයතන හා නිලධාරීහු<br>- ජල සම්පාදනය කරන ආයතන<br>උදා ÷ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>- සෞඛ්‍ය සේවා සපයන ආයතන<br>- අධ්‍යාපන සේවා ලබා දෙන ආයතන<br>- ප්‍රවාහණ සේවා සපයන ආයතන<br>- විදුලිය බලය සපයන ආයතන<br>- පණිවිඩ හුවමාරුව හා සම්බන්ධ ආයතන<br>• රජය මඟින් සපයන වෙනත් පොදු සේවා<br>- පරිසර සංරක්ෂණය<br>- සමාජ සංරක්ෂණය<br>- විවිධ සුභසාධන සේවා<br>• ප්‍රදේශයේ පොදු සේවා සපයන වෙනත් සංවිධාන හා එමඟින් සපයන පොදු සේවා<br>- ජන ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට පොදු සේවා ඉවහල් වන ආකාරය | • ජන ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට පොදු සේවා ඉවහල් වන බවට අදහස් දක්වයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.1.3<br>පොදු සේවා සපයන ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම් විමර්ශනය කරයි | • පොදු සේවා ක්‍රියාත්මක කරන ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම්<br>- සියලු ම පොදු සේවා පොදු ජන අවශ්‍යතා ඉටු කරන බැවින් මානව හිතවාදී ව කටයුතු කිරීමේ වැදගත්කම<br>- සියලු පොදු සේවා කාර්යක්ෂම ව හා විධිමත් ව සැපයිය යුතු බව<br>• ජලය සම්පාදනය<br>- පිරිසිදු ජලය සැපයීම, විධිමත් ව බෙදා හැරීම, කලට වේලාවට නඩත්තු කටයුතු කිරීම<br>• සෞඛ්‍ය සේවා<br>- අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක සේවා විධිමත් ව සැපයීම,<br>- බෝ වන හා බෝ නොවන රෝග වැළැක්වීම<br>- ජනතාව දැනුම්වත් කිරීම<br>• අධ්‍යාපන සේවා<br>- සමාජයට වැඩදායි පුරවැසියන් බිහි කළ හැකි අධ්‍යාපනයක් ලබා දීම<br>- ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම<br>- අවශ්‍ය පහසුකම් සැපයීම | • පොදු සේවා සපයන ආයතනවල යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.<br>• පොදු සේවා සපයන ආයතන තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම ජන ජීවිතයේ යහපැවැත්මට හේතු වන බව ප්‍රකාශ කරයි.<br>• පොදු සේවාවලට සම්බන්ධ නිලධාරීන් කාර්යක්ෂම ව සේවා සැපයීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • ප්‍රවාහණය<br>- මඟී ආරක්‍ෂාව සහතික කිරීම<br>- කාර්යක්ෂම සේවා සැපයීම<br>- නීතිගරුක, විනයගරුක හා ආචාරශීලී සේවාවක් සැපයීම<br>• විදුලිය<br>- පාරිභෝගිකයන්ට අඛණ්ඩ ව විදුලිය සැපයීම<br>- විධිමත් ව සේවා සැපයීම<br>• පණිවිඩ හුවමාරුව<br>- විශ්වාසවන්ත ව කාර්යක්ෂම ව හා ක්‍රමවත් ව සේවා සැපයීම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.1.4 පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ පුරවැසි අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ දැනුම්වත් ව කටයුතු කරයි. | • පොදු සේවා සම්බන්ධ පුරවැසියන් සතු අයිතිවාසිකම්<br>• පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් සතු වගකීම් හා යුතුකම්<br>- ලැබෙන සේවා අරපිරිමැස්මෙන් පරිහරණය<br>- සේවා සඳහා ගෙවීම් පියවීමට අවංක වීම<br>- පොදු සේවා පිළිබඳ යහපත් ආකල්ප සංවර්ධනය කර ගැනීම<br>- සේවා හා සම්බන්ධ දේපළ, උපකරණ සුරැකීම | • පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් පුරවැසි අයිතිවාසිකම් හා යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• පොදු සේවාවන්ට සම්බන්ධ පුරවැසි යුතුකම් ඉටු කිරීම කාර්යක්ෂම ව සේවා සැපයීමට ආධාර වන බව ද ප්‍රකාශ කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය**<br>8.2.<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි | 8.2.1<br>තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්‍ෂණවලට අනුගත වෙයි. | • තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණ<br>- සාකච්ඡා මඟින් නිවැරදි තීරණවලට එළඹීම<br>- අන්‍ය මත ඉවසීම<br>- බහුතර කැමැත්ත පිළිබඳ මතය විමසීම හා එකඟ වීම<br>- නායකත්වයට ගරු කිරීම<br>- සහයෝගයෙන් කටයුතු කිරීම | • පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ නම් කරයි.<br>• පවුල් ඒකකය තුළ පැවතිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පවුලේ යහපැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරයි.<br>• පවුල් ඒකකයේ සාමාජිකයකු ලෙස ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්මට අදාළ ගුණාංග වර්ධනය කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි.<br>• පාසල් සමාජය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ විස්තර කරයි.<br>• පාසල් සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගවලට අනුගත වෙමින් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 8.2.2<br>ළමා අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | • ළමා අයිතිවාසිකම් හැඳින්වීම<br>• ළමයකුට හිමි වන අයිතිවාසිකම්<br>• අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්<br>• ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතන | • ළමා අයිතිවාසිකම් පැහැදිලි කරයි.<br>• ළමා අයිතිවාසිකම් නිසි පරිදි භුක්ති විඳීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ළමා අයිතිවාසිකම් භුක්ති විඳීම ළමා සංවර්ධනයට හේතු වන ආකාරය විස්තර කරයි.<br>• ළමා අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතනවල කාර්යභාරය විස්තර කරයි. | 03 |
| | 8.2.3<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පැවැත්ම සහතික වන ආකාරයෙන් චිත්තවේග හසුරුවා ගනියි. | • විවිධ චිත්තවේග<br>• චිත්තවේග අනුව හැසිරීම් රටාව විවිධ වන බව<br>• චිත්තවේග සුභවාදී ව හසුරුවා ගැනීමේ වැදගත්කම | • පුද්ගලයා තුළ ඇති වන විවිධ චිත්තවේගී ස්වභාවයන් විස්තර කරයි.<br>• චිත්තවේග පුද්ගල හැසිරීම කෙරෙහි විවිධාකාරයෙන් බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු වශයෙන් චිත්තවේග සුභවාදී ව හසුරුවා ගැනීම පුද්ගල ජීවිතයට හා සමාජ යහපතට හේතු වන බව ප්‍රකාශ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.2.4<br>නායකත්වයේ අවශ්‍යතාව හඳුනා ගනිමින් නායකත්ව ගුණාංග ප්‍රගුණ කරයි. | • නායකත්වය හැඳින්වීම<br>• නායකත්වයේ අවශ්‍යතාව<br>• නායකත්ව ගුණාංග<br>• නායකත්වය හා අනුගාමිකත්වය | • නායකත්වය යන්න කෙටියෙන් පැහැදිලි කරයි.<br>• සමාජයේ යහපැවැත්ම සඳහා යහගුණයෙන් යුතු නායකත්වයේ අවශ්‍යතා ව පිළිබඳ විස්තර කරයි.<br>• නායකත්වය තුළ පැවතිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග නම් කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සමාජයේ යහපැවැත්ම සඳහා අනුගාමිකයකු ලෙස වර්ධනය කරගත යුතු ගුණාංග පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. | 02 |
| | 8.2.5<br>ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අවශ්‍ය ගුණාංග වර්ධනය කර ගනියි. | • ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අවශ්‍ය ගුණාංග හඳුනා ගැනීම<br>• ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතු වන ආකාරය<br>- ජන සමාජය තුළ සුහදත්වය වර්ධනය වීම<br>- ගැටුම් අවම වූ සමාජයක් බිහි වීම | • ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග පැහැදිලි කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතු වන බව ප්‍රකාශ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | - නීතිගරුක හා ගුණගරුක පුරවැසියන් බිහි වීම<br>- සාමකාමී ජන සමාජයක් බිහි වීම<br>- සියලු දෙනාගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **බහුසංස්කෘතික ජන සමාජය**<br><br>8.3<br>බහුසංස්කෘතික ජන සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙයි. | 8.3.1<br>බහුසංස්කෘතික ජන සමාජයක අංග ලක්‍ෂණ විශ්ලේෂණය කරයි. | • බහුසංස්කෘතික ජන සමාජය හැඳින්වීම<br>• බහුසංස්කෘතික ජන සමාජයක ලක්‍ෂණ<br>- විවිධ ජන වර්ග<br>- විවිධ ආගම්<br>- විවිධ භාෂා<br>- විවිධ සිරිත්-විරිත්<br>- විවිධ සංස්කෘතික උරුම පැවතීම | • බහුසංස්කෘතික ජන සමාජය යන්න අර්ථ දක්වයි.<br>• බහුසංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි. | 03 |
| | 8.3.2<br>සංස්කෘතික විවිධත්වය තුළ සමගියෙන් හා සහජීවනයෙන් කටයුතු කරයි. | • ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය<br>- භාෂා<br>- ආගම්<br>- සිරිත්-විරිත්<br>- සංස්කෘතික උරුම<br>• විවිධ සංස්කෘතික සම්ප්‍රදාය, සිරිත්-විරිත් හා උත්සව<br>• විවිධ ජන වර්ග හා බැඳුණු සිරිත්-විරිත්<br>උදා :- උපතට පෙර සිට මරණයෙන් පසු තෙක් | • ශ්‍රී ලංකාව බහුසංස්කෘතික ජන සමාජයක් බව පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකා ජන සමාජයේ පවතින විවිධ සංස්කෘතිවලට අයත් සංස්කෘතික අංග පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• බහුසංස්කෘතික ජන සමාජයක සාමාජිකයකු ලෙස සහජීවනයෙන් යුතු ව ජීවත් වීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | | • විවිධ ආගම් හා බැඳුණු සිරිත්-විරිත්, සම්ප්‍රදාය, උත්සව හා ඒවායේ වැදගත්කම<br>උදා :- බෞද්ධ (වෙසක්, පොසොන්)<br>හින්දු (තෛපොංගල්, දීපවාලි)<br>ඉස්ලාම් (රාමසාන්, හජ්ජි)<br>ක්‍රිස්තියානි (නත්තල්, මහ සිකුරාදා)<br>• එක් එක් සංස්කෘතියෙහි අනන්‍යතාව තහවුරු වී තිබීම<br>• විවිධත්වයෙහිලා සමඟියෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම<br>• වෙනත් රටවල ද බහුසංස්කෘතික ජන සමාජ පවතින බව<br>උදා :- ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය | • වෙනත් රටවල බහුසංස්කෘතික ලක්ෂණ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.3.3<br>ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමඟියට හා තිරසර සාමය ගොඩනගාගැනීමට දායක වෙයි. | • අන්‍යෝන්‍ය අවබෝධය නිසා ගැටුම් අවම වීම හා ජන කොටස් අතර සමඟිය තහවුරු වීම<br>• සංස්කෘතික විවිධත්වය මඟින් රට සංවර්ධනය කර ගැනීමට එකමුතු ව කටයුතු කිරීම<br>• සංස්කෘතික සමෝධානය ඇති කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග<br>• ඵලදායි ආර්ථික කටයුතුවල යෙදෙමින් රට සංවර්ධනයට දායක වීම<br>• සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම<br>• බහුසංස්කෘතික ජන සමාජය තුළ තිරසර සාමය ගොඩනැඟීම | • සාමකාමී ජන සමාජයක යහපැවැත්ම සඳහා අන්‍යෝන්‍ය අවබෝධය වැදගත් වන බව ප්‍රකාශ කරයි.<br>• බහුසංස්කෘතික ජන සමාජයක සංස්කෘතික සමෝධානය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.<br>• තම සංස්කෘතික අනන්‍යතාව රැක ගනිමින් අන්‍ය සංස්කෘතිවලට ගරු කරමින් ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• බහුසංස්කෘතික ජන සමාජයක් තුළ තිරසර සාමය ගොඩනැඟීමේ වැදගත්කම විස්තර කරයි.<br>• තිරසර සාමය ජාතික සංවර්ධනයට හේතු වන අයුරු පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **කාලීන ගැටලු**<br>8.4<br>ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරී ව කටයුතු කරයි | 8.4.1<br>අනතුරු හා විපත් හඳුනා ගෙන ඒවා අවම කිරීමට දායක වෙයි. | • අනතුරු හා විපත් හඳුනා ගැනීම<br>• ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඇති වන අනතුරු හා විපත්<br>• අනතුරුවලින් හා විපත්වලින් වන හානි අවම කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග<br>• අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග<br>• අදාළ ආයතන පිළිබඳ ව දැනුම්වත් වීම හා ඉන් ලබා දෙන උපදෙස් නිසි පරිදි පිළිපැදීම<br>- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>- රෝහල/පොලීසිය/කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>- වෙනත් ආයතන/පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන සම්බන්ධ ගිනි නිවන ඒකක | • අනතුරු හා විපත් නම් කරයි.<br>• අනතුරු හා විපත් ඇති වීමට බලපාන හේතු පැහැදිලි කරයි.<br>• අනතුරුවලින් හා විපත්වලින් වන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි.<br>• අනතුරු වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.<br>• අනතුරුවල දී හා ආපදාවල දී සහාය ලබාගත හැකි ආයතන නම් කරයි.<br>• අනතුරුවල දී හා ආපදාවල දී සහාය ලබා දෙන ආයතනවල උපදෙස් පිළිපැදීමේ වැදගත්කම පැහැදිලි 3කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.4.2<br>අනතුරුවල දී හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරයි. | • ඒ ඒ අනතුරු අවස්ථාවලට අදාළ ව අවසරෝචිත ව ශක්තිමත් ව කටයුතු කිරීම<br>• අනතුරක් සිදු වූ අවස්ථාවක දී අවදානම් ලෙස එම ස්ථානවලට ප්‍රවේශ නොවීම<br>• අනතුරුවලට ලක් වූවන්ට හා ප්‍රථමාධාර සපයන්නන්ට උදවු කිරීම<br>• අදාළ ආයතන දැනුම්වත් කිරීම<br>• අධිසංවේදී නොවීම<br>• සන්සුන් ව හා ඉවසීමෙන් කටයුතු කිරීම | • අනතුරු හා විපත් අවස්ථාවල දී තමන්ගේ හා අන්‍යයන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අනතුරු හා විපත් අවස්ථාවල දී අවසරෝචිත ව කටයුතු කිරීමේ අවශ්‍යතාව සාකච්ඡා කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.4.3<br>ආපදා කළමනාකරණය කරයි. | • අනතුරු හා විපත් සිදු විය හැකි ස්ථාන<br>- නිවස<br>- අවට පරිසරය<br>- පාසල<br>- වැඩබිම<br>• ස්ථානීය අනතුරු හැරුණු විට වෙනත් අනතුරු වන අවස්ථා<br>- වන සතුන්ගෙන්<br>- සුනඛයන්ගෙන්<br>- සර්පයන්ගෙන්<br>• ආහාර හා ඖෂධ සම්බන්ධ විපත්/අනතුරු<br>• අහිතකර පුරුදු නිසා සිදු වන අනතුරු<br>- මත්පැන් පානය කර රිය පැදවීමෙන් සිදු වන අනතුරු | • අනතුරු හා විපත් සිදු විය හැකි අවස්ථා පිළිබඳ සැලකිලිමත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අනතුරුවලින් හා විපත්වලින් ආරක්ෂා වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි.<br>• ස්ථානීය අනතුරු හැරුණු විට වෙනත් අනතුරු සිදු විය හැකි අවස්ථාවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ආහාර හා ඖෂධ නිසා සිදු වන විපතවලින් හා අනතුරුවලින් ආරක්ෂා වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අහිතකර ජීවන පුරුදු අනතුරු හා විපත් ඇති වීමට හේතු වන බව පැහැදිලි කරයි.<br>• අහිතකර ජීවන පුරුදුවලින් මිදීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.4.4<br>මාර්ග නීතිරීති පිළිපදිමින් මාර්ග අනතුරු අවම කිරීමට ක්‍රියා කරයි. | • මාර්ග අනතුරු<br>- මාර්ග අනතුරු හැඳින්වීම<br>- මාර්ග අනතුරුවලට හේතු<br>- අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග<br>- මාර්ග නීතිරීති පිළිපැදීම<br>- මාර්ග අනතුරු සිදු වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය<br>• දුම්රිය අනතුරු<br>- දුම්රිය අනතුරුවලට හේතු<br>- අනතුරු වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග<br>- දුම්රිය අනතුරු සිදු වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය | • වර්තමානයේ දී සිදු වන මාර්ග අනතුරු හා විපත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• මාර්ග අනතුරුවලට හේතු පැහැදිලි කරයි.<br>• අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.<br>• මාර්ග නීතිරීති සංඥා හා සලකුණු ඇසුරින් පැහැදිලි කරයි.<br>• දුම්රිය අනතුරුවලට හේතු පැහැදිලි කරයි.<br>• දුම්රිය අනතුරු වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.<br>• මාර්ග හා දුම්රිය අනතුරු සිදු වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරයි. | 02 |
| | 8.4.5<br>රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් සිදු වන අනතුරු අවම කිරීමට දායක වෙයි. | • රසායනික ද්‍රව්‍ය භාවිතය හා එමඟින් අනතුරු සිදු විය හැකි ආකාරය<br>• අනතුරක් සිදු වූ අවස්ථාවක දී ගත යුතු ක්‍රියාමාර්ග<br>• අනතුර වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග | • රසායන ද්‍රව්‍ය භාවිතය මඟින් සිදු විය හැකි අනතුරු පැහැදිලි කරයි.<br>• රසායන ද්‍රව්‍ය සම්බන්ධ අනතුරක් සිදු වූ අවස්ථාවක දී ගත යුතු ක්‍රියාමාර්ග විස්තර කරයි.<br>• රසායන ද්‍රව්‍ය ආශ්‍රිත අනතුරු වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.4.6<br>දූරිය හැකි ජීවන රටාවකට අනුගත වෙමින් තිරසර සංවර්ධනයට දායක වෙයි. | • දැරිය හැකි ජීවන රටාවක් යනු කුමක් දැයි හැඳින්වීම<br>• දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීම<br>• ආහාර හා ඇඳුම් පැල ඳුම්<br>• සෞඛ්‍ය හා සනීපාරක්ෂාව<br>• ප්‍රවාහණ අවශ්‍යතා ඉටු කර ගැනීම<br>• බලශක්තිය භාවිතය<br>• ජලය හා විදුලිය<br>• විවේකය හා විනෝදය ගත කිරීම<br>• නිවාස සැලසුම් කිරීම හා තැනීම | • දැරිය හැකි ජීවන රටාව පිළිබඳ සාකච්ඡා කරයි.<br>• එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී දූරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීමෙන් තිරසර සංවර්ධනයට දායක විය හැකි බවට අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ගැටලු විසඳීම හා තීරණ ගැනීම**<br>8.5<br>ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායි ව තීරණ ගනියි. | 8.5.1<br>එදිනෙදා ජීවිතයේ දී මුහුණ පෑමට සිදු වන විවිධ ගැටලු හා අභියෝග පිළිබඳ ව විමසා බලයි. | • ගැටලු හා අභියෝග හඳුනා ගැනීම<br>• ගැටලු හා අභියෝග සරල ව නිර්වචනය කිරීම<br>• එදිනෙදා ජීවිතයේ දී මුහුණ දීමට සිදු වන ගැටලු හා අභියෝග පිළිබඳ විමසිලිමත් වීමේ වැදගත්කම | • ගැටලු හා අභියෝග සරල ව අර්ථ දක්වයි.<br>• එදිනෙදා ජීවිතයේ දී මුහුණ පාන ගැටලු හා අභියෝග පිළිබඳ විමසිලිමත් ව කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී මතු වන ගැටලුවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගත යුතු බවට අදහස් දක්වයි. | 03 |
| | 8.5.2<br>ජීවිතයේ විවිධ ගැටලුවලට හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි | • විවිධ ගැටලු හා අභියෝග ජය ගැනීමේ නිර්මාණශීලී ක්‍රම අනුගමනය කිරීම<br>• ඕනෑ ම ගැටලුවකට හා අභියෝගයකට විසඳුම් පවතින බව<br>• ගැටලු හා අභියෝග ජීවිත සාර්ථකත්වයට අදාළ කර ගත හැකි ආකාරය<br>- චිත්ත ධෛර්ය වර්ධනයට යොමු වීම<br>- විවිධ නිර්මාණ බිහි කර ගැනීමට යොමු වීම<br>- වැරදි නිවැරදි කර ගැනීමට යොමු වීම<br>- විකල්ප විසඳුම් සඳහා උපදේශන සේවා ලබා ගැනීම | • ගැටලුවලට මුහුණ දීමට සිදු වීම සාමාන්‍ය දිවි පැවැත්මට අදාළ සිද්ධියක් බව පැහැදිලි කරයි.<br>• ඕනෑ ම අභියෝගයකට හා ගැටලුවකට විසඳුම් පවතින බව විස්තර කරයි.<br>• ජීවිතය ජය ගැනීම සඳහා අභියෝගවලට හා ගැටලුවලට නිර්මාණශීලී විසඳුම් සෙවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **වැඩ ලෝකය**<br>**8.6**<br>වැඩ ලෝකයට හුරු වෙයි. | 8.6.1<br>වැඩ ලෝකයේ විවිධත්වය අගය කරයි. | • වැඩ ලෝකය හැඳින්වීම<br>• වැඩ ලෝකයේ පවතින විවිධ රැකියා ක්ෂේත්‍ර<br>- කෘෂිකාර්මික<br>- කාර්මික<br>- සේවා<br>• ස්වයං රැකියා<br>• එක් එක් ක්ෂේත්‍රයට අදාළ රැකියා අවස්ථාවලට නිදසුන් | • වැඩ ලෝකයේ විවිධත්වය පැහැදිලි කරයි.<br>• වැඩ ලෝකයේ විවිධත්වයෙහිලා විවිධ රැකියා අවස්ථා පවතින බව විස්තර කරයි. | 02 |
| | 8.6.2<br>ශ්‍රම අභිමානයෙන් යුක්ත ව කටයුතු කිරීමේ වැදගත්කම විමර්ශනය කරයි. | • ශ්‍රම අභිමානය හැඳින්වීම<br>• ශ්‍රම අභිමානයෙන් යුතු ව කටයුතු කිරීමේ වැදගත්කම<br>• ශ්‍රම අභිමානයෙන් යුතු ව කටයුතු කිරීමෙන් සේවා යෝජකයාට, සේවා දායකයාට, සේවාලාභියාට අත්වන ප්‍රයෝජන | • ශ්‍රම අභිමානයෙන් යුතු ව සේවයේ යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ශ්‍රම අභිමානයෙන් යුතු ව කටයුතු කිරීම රැකියා තෘප්තියට හේතු වන බවට කරුණු ඉදිරිපත් කරයි.<br>• ශ්‍රම අභිමානයෙන් කටයුතු කිරීම නිසා අත් වන ප්‍රයෝජන පැහැදිලි කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.6.3<br>සෑම රැකියාවක් ම සමාජයේ ප්‍රගමනයට හේතු වන ආකාරය ගවේෂණය කරයි. | • සමාජයේ පවත්නා විවිධ අවශ්‍යතා<br>• සෑම රැකියාවක් ම, සමාජයේ පවතින විවිධ අවශ්‍යතා ඉටු කිරීමට දායක වන බව<br>• පුද්ගල හැකියා අනුව රැකියාවල නිරත වීම මගින් සමාජ ප්‍රගමනයට දායක වන අයුරු | • සෑම රැකියාවක් ම සමාජ අවශ්‍යතා ඉටු කිරීමට දායක වන අයුරු පැහැදිලි කරයි.<br>• සෑම රැකියාවක් ම සමාජ අභිවෘද්ධියට හේතු වන බව ප්‍රකාශ කරයි. | 01 |
| | 8.6.4<br>පුහුණු ශ්‍රමයේ වැදගත්කම විමසා බලයි. | • ශ්‍රමය, කායික හා මානසික ශ්‍රමය ලෙස වර්ග කර දැක්වීම<br>• ඵලදායි ශ්‍රමිකයකු වීමට පුහුණුවීම්වල අවශ්‍යතාව<br>• පුහුණු ශ්‍රමය ගුණාත්මකභාවය කෙරෙහි බලපාන ආකාරය<br>• පුහුණු ශ්‍රමිකයකුට දේශීය මෙන් ම විදේශීය රැකියා වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් පැවතීම<br>• පුහුණුව ලබා දෙන පාඨමාලා උදා - වෘත්තීය පුහුණු පාඨමාලා<br>• වෘත්තීය පුහුණු පහසුකම් සපයන ආයතන රාජ්‍ය ආයතන/පෞද්ගලික ආයතන | • ශ්‍රමිකයකු වශයෙන් තම රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණුවීම් ලබා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ශ්‍රමිකයකුට වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා ඇති අවස්ථා ප්‍රකාශ කරයි.<br>• ශ්‍රමයේ ඵලදායිතාව පුහුණුව මත රඳා පවතින බව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.6.5<br>යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග අභ්‍යන්තරීකරණය කර ගනියි. | • යහපත් ශ්‍රමිකයකු සතු ගුණාංගවලට නිදසුන්<br>- නියමිත වේලාවට සේවයට පැමිණීම<br>- කැප වීම<br>- තෘප්තිමත් ව රැකියාවේ නිරත වීම<br>- යුතුකම් හා වගකීම් ඉටු කිරීම<br>- සහයෝගයෙන් කටයුතු කිරීම<br>- වෘත්තීය සංවර්ධනය සඳහා උනන්දු වීම<br>- නායකත්වයට ගරු කිරීම<br>- ආයතනයේ නීතිරීති හා සම්ප්‍රදායවලට ගරු කිරීම | • යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග පැහැදිලි කරයි.<br>• සේවා ස්ථානයෙහි දී යහපත් ගුණාංග පවත්වා ගෙන යාමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.6.6<br>සේවා ස්ථානයේ අපේක්ෂා විමර්ශනය කරයි. | • සේවා ස්ථානයක අපේක්ෂා<br>- බාහිර පෙනුම නිසි පරිදි පවත්වා ගෙන යාම<br>- නියමිත වේලාවට පැමිණීම<br>- වේලාවට වැඩ කිරීම<br>- සේවා ස්ථානයේ දියුණුවට කැපවීම<br>- කාර්යක්ෂමතාව<br>- වැටුපට සරිලන ලෙස උපරිම සේවාවක් ලබා දීම | • ශ්‍රමිකයකු වශයෙන් සේවා ස්ථානයක අපේක්ෂා පිළිබඳ සංවේදී වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• සේවා ස්ථානයේ අපේක්ෂා ඉටු කිරීම සේවාදායකයාගේ යුතුකම හා වගකීම බව පැහැදිලි කරයි. | 01 |
| | 8.6.7<br>සේවක අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ පරීක්ෂා කරයි. | • අයිතිවාසිකම්<br>- ආරක්ෂිත, පිරිසිදු හා ප්‍රසන්න සේවා පරිසරයක්<br>- රැකියාවට අදාළ මෙවලම්<br>- කෑම විවේකය<br>- මූලික පුහුණුව<br>- නිරන්තර වෘත්තීය සංවර්ධනය<br>- නිවාඩු (වරප්‍රසාදයක් ලෙස) ,මූල්‍ය ප්‍රතිලාභ<br>- වෘත්තීය සමිති සාමාජිකත්වය | • සේවක අයිතිවාසිකම් හා යුතුකම් වගු ගත කරයි.<br>• සේවක අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | | • යුතුකම්<br>- නියමිත වේලාවට පැමිණීම<br>- පෞද්ගලික පෙනුම<br>- පැවැත්ම<br>- මහන්සියෙන් වැඩ කිරීම<br>- කණ්ඩායම් සමාජිකයකු ලෙස කටයුතු කිරීම<br>- සේවා අවශ්‍යතා පරිදි වැඩ කිරීම<br>- සේවා ස්ථානයේ පහසුකම්වලට හා මෙවලම්වලට ගරු කිරීම හා ආරක්ෂා කිරීම<br>- සේවා ස්ථානයේ දියුණුවට සාමුහික ව කටයුතු කිරීම | | |
| | 8.6.8<br>පෞද්ගලික වෘත්තීය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේ වැදගත්කම අගය කරයි. | • පෞද්ගලික කාර්ය සාධනය<br>• කුසලතා<br>• ඉගෙනීම් ක්‍රම<br>- පාරම්පරික ශිල්පීය/වෘත්තීය ක්‍රමවේද පවත්වා ගෙන යෑම<br>- තාක්ෂණය යොදා ගැනීම<br>- විශේෂඥ අත්දැකීම් ලබා ගැනීම | • ශ්‍රමිකයකු වශයෙන් පෞද්ගලික කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• තමා සතු කුසලතා සහ තම අභිරුචි පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශකයකු සමඟ සාකච්ඡා කරයි.<br>• වෘත්තීය සංවර්ධනය සඳහා විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 8.6.9<br>සේවාලාභීන් තෘප්තිමත් කළ හැකි විවිධ උපාය මාර්ග විශ්ලේෂණය කරයි. | • සේවාලාභියා තෘප්තිමත් කිරීමෙන් සේවා ස්ථානය කෙරෙහි ඇති විශ්වාසය තහවුරු වීම<br>• සේවාලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ<br>• සේවාලාභීන් තෘප්තිමත් බවට සහතිකය<br>• නිත්‍ය සේවාලාභීන් සමඟ සබඳතා අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම | • සේවාලාභීන් තෘප්තිමත් කිරීමේ උපාය මාර්ග යෝජනා කරයි.<br>• සේවාලාභීන් මැනවින් හඳුනා ගෙන කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 01 |
| | 8.6.10<br>ආදායම් ඉපයීම ජීවන රටාවට බලපාන ආකාරය විමර්ශනය කරයි. | • හොඳ ආදායමක් ලැබීමෙන් අත් වන ප්‍රතිලාභ<br>• අඩු ආදායමක් ලැබීම නිසා අත් වන ප්‍රතිවිපාක<br>• සමාජ හිතකාමී ක්‍රියාමාර්ග ඔස්සේ තම අදායම වැඩි කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමෝපාය හඳුනා ගැනීම | • ආදායම වැඩි කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි.<br>• තම ආදායම වැඩි කර ගැනීම සඳහා බුද්ධිමත් ව හා සමාජ හිතකාමී ව කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• හොඳ ආදායමක් ලැබීම ජීවන තත්ත්වයේ සංවර්ධනයට හේතු වන ආකාරය පැහැදිලි කරයි. | 01 |

# ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 8.1 පොදු සේවා

ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන රජය, පෞද්ගලික අංශය හා වෙනත් සංවිධාන මඟින් විවිධ සේවා සපයනු ලබයි. ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සංකීර්ණ වීමත් සමඟ ම එම අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙම පොදු සේවාවල මූලික අරමුණ වේ. වර්තමාන ජන සමාජය ප්‍රයෝජනයට ගන්නා බොහෝ සේවා ජනතාවට පෞද්ගලික ව සපුරා ගැනීම ද අපහසු වේ.

පොදු සේවා ජනතාවට අත්‍යවශ්‍ය සේවා බවට පත් ව ඇති බැවින් ඒවා සපයන ආයතන හා නිලධාරීහු ජනතාව වෙත තම වගකීම් හා යුතුකම් මැනවින් ඉටු කිරීමට නෛතික ව මෙන් ම සදාචාරාත්මක ව ද බැඳී සිටිති.

එමෙන් ම එම සේවා භුක්ති විඳීම සම්බන්ධයෙන් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීමට ජනතාව ද නෛතික ව මෙන් ම සදාචාරාත්මක වශයෙන් ද බැඳී සිටිති.

පොදු සේවා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට බලපාන ආකාරයත්, පොදු සේවා සපයන ආයතනවල නිලධාරීන්ගේ වගකීම් හා යුතුකම් මෙන් ම, එම සේවා භුක්ති විඳීම වෙනුවෙන් ජනතාවගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් ආදිය පැහැදිලි වන ආකාරයට මෙම ඒකකය අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කරවීම ඉතා වැදගත් වේ.

**නිපුණතාව** 8.1

- ජන ජීවිතයේ යහපත පිණිස පවත්නා පොදු සේවා ඵලදායි ව හා නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

8.1.1 පොදු සේවා හඳුනා ගෙන එහි අවශ්‍යතා හා කාලීන වැදගත්කම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි.**

**ඉගෙනුම් පල**

- පොදු සේවා හඳුන්වයි.
- පොදු සේවාවල අවශ්‍යතාව පැහැදිලි කරයි.
- පොදු සේවාවල ආරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.
- පොදු සේවාවල කාලීන වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.
- පොදු සේවාවල පොදු ලක්ෂණ පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පොදු සේවා හැඳින්වීම
  ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශ (පළාත් පාලන ආයතන, ස්වේච්ඡා සංවිධාන) මඟින් පොදුවේ සපයන සේවා පොදු සේවා ය.
- පොදු සේවාවල අවශ්‍යතාව
  - ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසුවෙන් හා ඵලදායි ව ඉටු කර ගැනීම සඳහා
  - පෞද්ගලික ව පහසුවෙන් ලබාගත නොහැකි අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා
  - ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීම සඳහා
  - ප්‍රදේශ අතර සම්බන්ධතා පවත්වාගෙන යෑමද සඳහා
  - සමාජ සුරක්ෂිතතාව මඟින් සමාජ සංවර්ධනය සඳහා
  - සමාජ අවශ්‍යතා ඉටු කිරීම මඟින් මානව අයිතිවාසිකම් සුරැකීම සඳහා
- පොදු සේවාවල විකාශනය
  ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානි සමයේ සිට රාජ්‍ය අනුග්‍රහය යටතේ පොදු සේවා පැවති බවට සාක්ෂ්‍ය හමු වී ඇත.
  උදාහරණ:-
  - රෝහල් පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම
  - ඔසු උයන් නිර්මාණය
  - වෛද්‍ය සේවා පවත්වා ගෙන යෑම
  - අධ්‍යාපන ආයතන පවත්වාගෙන යෑම
- පොදු සේවාවල කාලීන වැදගත්කම
  - මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම
  - ජන සංඛ්‍යා වර්ධනය
  - කාර්මික දියුණුව හා තාක්ෂණයේ දියුණුව සමඟ පොදු සේවාවල වැදගත්කම ඉස්මතු වීම
  - ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය වැඩි දියුණු වීම.

- පොදු සේවාවල ලක්ෂණ

  උදාහරණ:-

  - පොදුවේ සැමට ලබාගත හැකි වීම
  - සැම පුද්ගලයකුට ම පහසුවෙන් ලබාගත හැකි වීම
  - මහජන සුභසිද්ධිය අරමුණු කරගෙන පවත්වාගෙන යෑම
  - සමස්ත ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම
  - අඩු ආදායම් ලාභී පුද්ගලයන්ට විශේෂ සහන සැලසීම
  - රජයෙන් පවත්වාගෙන යනු ලබන පොදු සේවා ලාභ අපේක්ෂාවෙන් තොර ව පවත්වා ගෙන යාම
  - පොදු සේවා ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යෑම සඳහා නෛතික රාමුවක් ක්‍රියාත්මක වීම

**ගුණාත්මක යෙදවුම්**

- වර්තමානයේ පවත්නා පොදු සේවා දැක්වෙන ඡායාරූප/ වීඩියෝ දර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

කණ්ඩායම් පැවරුම් / ඉදිරිපත් කිරීම් / කණ්ඩායම් ක්‍රියාකාරකම් යටතේ විෂය කරුණු අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.1.2 පොදු සේවා සපයන ආයතන හඳුනා ගෙන ජන ජීවිතය යහපත් කර ගැනීමට යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි.**

**ඉගෙනුම් පල**

- තම ප්‍රදේශයට සැපයෙන පොදු සේවා නම් කරයි.
- පොදු සේවා සපයන ආයතන හා ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ කාර්යභාරය පැහැදිලි කරයි.
- රජය මඟින් සැපයෙන වෙනත් පොදු සේවා පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- පොදු සේවා සපයන වෙනත් සංවිධානවලට නිදසුන් දක්වයි.
- ජන ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට පොදු සේවා ඉවහල් වන බවට අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අප ප්‍රදේශයේ පොදු සේවා
  - ජල සම්පාදනය
  - විදුලිය
  - අධ්‍යාපනය
  - පණිවිඩ හුවමාරුව
  - තැපෑල
  - සෞඛ්‍යය
  - ප්‍රවාහණය
  - ආරක්ෂක සේවා
  - සමුපකාරය

ඉහත සඳහන් එක් එක් පොදු සේවා මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. රාජ්‍ය අංශය මඟින් හා පෞද්ගලික අංශය මඟින් මෙම සේවා පවත්වා ගෙන යන බව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

- රාජ්‍ය අංශය මඟින් සපයන වෙනත් පොදු සේවා
  - පරිසර සංරක්ෂණය

  උදාහරණ:-
  - වන වගා ව්‍යාපෘති ආරම්භ කිරීම හා පවත්වාගෙන යෑම
  - රක්ෂිත වනාන්තර ඇති කිරීම
  - වන ජීවීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
  - පරිසරයට හානිකර මිනිස් ක්‍රියාකාරකම් වැළැක්වීම

  - සමාජ සංරක්ෂණය

  උදාහරණ:-
  - සමෘද්ධි දීමනා
  - සහනාධාර ලබාදීම
  - වැඩිහිටි නිවාස පවත්වාගෙන යෑම
- විවිධ සුබසාධක සේවා
- ප්‍රදේශයේ විවිධ සංවිධාන මඟින් සපයන පොදු සේවා
  - සමුපකාර ව්‍යාපාරය හා ඉන් සැපයෙන සේවා
  - පාරිභෝගික භාණ්ඩ පහසු මිලට සැපයීම
  - සමූපකාර ණය දෙන සමිති මඟින් සාමාජිකයන්ට ණය ලබා දීම
  - ප්‍රවාහණ/ අවමංගල සේවා/ ආරෝග්‍යශාලා වැනි සේවා පවත්වාගෙන යෑම
- පොදු සේවා සපයන ආයතන හා නිලධාරීහු

එක් එක් පොදු සේවාවට අදාළ ආයතන හා ජනතාවට සමීප ව කටයුතු කරන නිලධාරීන් හා ඔවුන්ගෙන් ඉටු වන සේවය පැහැදිලි කරන්න.

- රජය මඟින් සැපයෙන වෙනත් පොදු සේවාවලට සම්බන්ධ ආයතන හා එම ආයතනවල ජනතාවට සමීප ව කටයුතු කරන නිලධාරීන් හා ඔවුන්ගෙන් ඉටු වන සේවය අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දෙන්න.

| පොදු සේවාව | පොදු සේවා සපයන ආයතනය | නිලධාරීහු |
|---|---|---|
| ජල සම්පාදනය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ඉංජිනේරුවෝ/ කාර්මික නිලධාරීහු/ වැඩහාර නිලධාරීහු/ මනු කියවන්නා |
| සෞඛ්‍යය | රෝහල | රෝහල් අධ්‍යක්ෂ/ විශේෂඥ වෛද්‍යවරු/ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීහු/ වෛද්‍ය නිලධාරීහු/ හෙදහෙදියෝ/ උපස්ථායක/ කම්කරුවෝ |
| අධ්‍යාපනය | පාසල | විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරුවරු, අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| විදුලිය බලය | ලංකා විදුලිය බල මණ්ඩලය | ඉංජිනේරුවරු/ විදුලි අධිකාරි, කාර්මික නිලධාරි/ වැඩමූලිකයෝ/ මනු කියවන්නෝ |
| පණිවිඩ හුවමාරුව | දූරකථන සමාගම් | දූරකථන ක්‍රියාකරුවෝ/කාර්මික නිලධාරීහු |
| තැපැල | තැපැල් කාර්යාලයය | තැපැල් ස්ථානාධිපති, ලියුම් බෙදන්නා |
| ආරක්ෂක සේවා | පොලීසිය | පොලිස් ස්ථානාධිපති, උපපොලිස් පරීක්ෂකවරු, පොලිස් සැරයන්වරු, කොස්තාපල්වරු, කාන්තා පොලිස් නිලධාරිනියෝ |
| ප්‍රවාහණය<br><br>සමුපකාරය | ලංකා ගමනාගමන මණ්ඩලය<br><br>විවිධ සේවා සමුහකාර සමිති | ඩිපෝ අධිකාරී/ කාර්මික නිලධාරිහු, රියැදුරෝ/ කොන්දොස්තරවරු<br><br>සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩලය/ සාමාන්‍යාධිකාරි/ කළමනාකරු/ වෙළෙඳ සහායක |

- සමුපකාරයට අදාළ ව ජනතාවට සමීප ව කටයුතු කරන නිලධාරීන් හා ඔවුන්ගෙන් ඉටු වන සේවය ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න.
  ( ජන ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට පොදු සේවා ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

- තම ප්‍රදේශයට රාජ්‍ය අංශය මඟින් හා පෞද්ගලික අංශය මඟින් සැපයෙන පොදු සේවාවලට අදාළ ඡායාරූප / චිත්‍ර / පෝස්ටර් / විස්තර පත්‍රිකා
- සම්පත් පුද්ගලයෝ
  පොදු සේවා සපයන ආයතනවලට සම්බන්ධ නිලධාරීන් සම්පත් පුද්ගලයන් ලෙස සහභාගි කරවා ගෙන (පහසුකම් තිබේ නම්) එම ආයතනවල කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කිරීමට අවස්ථාව සලසා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය වන පරිදි ක්‍රියාකාරී ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය මඟින් අදාළ විෂය කරුණු අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර, සුදුසු නිර්ණායක මත ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

නිපුණතා මට්ටම

8.1.3 පොදු සේවා සපයන ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම් විමර්ශනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි.**

**ඉගෙනුම් පල**

- පොදු සේවා සපයන ආයතනවල යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.
- පොදු සේවා සපයන ආයතන තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම ජන ජීවිතයේ යහපැවැත්මට හේතු වන බව ප්‍රකාශ කරයි.
- පොදු සේවාවලට සම්බන්ධ නිලධාරීන් කාර්යක්ෂම ව සේවා සැපයීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සියලු ම පොදු සේවා මහජන අවශ්‍යතා ඉටු කරන බැවින් මානව හිතවාදී ව කටයුතු කිරීමේ වැදගත්කම
- සියලු ම පොදු සේවා කාර්යක්ෂම ව හා විධිමත් ව සැපයිය යුතු බව
- පොදු සේවා සපයන ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම්

| පොදු සේවාව | සපයන ආයතනය | පොදු සේවාව සපයන ආයතනය හා බැඳුණු වගකීම් හා යුතුකම් |
|---|---|---|
| ජල සම්පාදනය | උදාහරණ:-<br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | උදාහරණ:-<br>• පිරිසිදු පානීය ජලය සැපයීම<br>• ජලය අඛණ්ඩ ව සැපයීම<br>• අපතේ යෑම වැළැක්වීම<br>• වැඩි වන ඉල්ලුම සපුරාලීම |
| විදුලි බලය | උදාහරණ:-<br>ලංකා විදුලිය බල මණ්ඩලය | උදාහරණ:-<br>• අඛණ්ඩ ව විදුලිය සැපයීම<br>• විදුලි රැහැන් පද්ධති නිසි පරිදි නඩත්තු කිරීම<br>• පාරිභෝගික පැමිණිලිවලට යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම<br>• විධිමත් ව සේවා සැපයීම |
| සෞඛ්‍ය | උදාහරණ:-<br>රෝහල | උදාහරණ:-<br>• රෝගීන්ට ප්‍රතිකාර කිරීම<br>• බෝ වන රෝග හා බෝ නොවන රෝග වැළැක්වීම<br>• අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක සේවා විධිමත් ව සැපයීම<br>• ජනතාව දැනුම්වත් කිරීම |

| පොදු සේවාව | සපයන ආයතනය | පොදු සේවාව සපයන ආයතනය හා බැඳුණු වගකීම් හා යුතුකම් |
|---|---|---|
| අධ්‍යාපනය | උදාහරණ:-<br>පාසල්/ පිරිවෙන්/<br>උසස් අධ්‍යාපන ආයතන | උදාහරණ:-<br>• නිසි පරිදි අධ්‍යාපනය ලබා දීම<br>• ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ නිපුණතා සංවර්ධනය<br>• සමාජයට වැඩදායක පුරවැසියන් බිහි කිරීම<br>• ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම<br>• නිර්මාණශීලිත්වය වර්ධනය කිරීම<br>• අවශ්‍ය පහසුකම් සැපයීම<br>• නව දැනුම සම්ප්‍රේෂණය කිරීම |
| ප්‍රවාහණය | උදාහරණ:-<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය/පෞද්ගලික බස් රථ සේවය/ දුම්රිය දෙපාර්තමේන්තුව | උදාහරණ:-<br>• කලට වේලාවට සේවා සැපයීම<br>• මගීන්ගේ ආරක්ෂාව සහතික කිරීම<br>• නීතිගරුක හා විනයගරුක මෙන් ම ආචාරශීලී ව සේවා සැපයීම<br>• කාර්යක්ෂම ව සේවා සැපයීම |
| පණිවිඩ හුවමාරුව | උදාහරණ:-<br>තැපැල් කාර්යාල/ නියෝජිත තැපැල් කාර්යාල හා දූරකථන සමාගම් | උදාහරණ:-<br>• කලට වේලාවට ලිපි බෙදා හැරීම<br>• රහස්‍ය භාවය සුරැකෙන පරිදි සේවය කිරීම<br>• කාර්යක්ෂම ව සේවා සැපයීම<br>• සන්නිවේදන කටයුතු පහසු කිරීම |

**ගුණාත්මක යෙදවුම්**

- යම් පොදු සේවා සැපයීම් අඩපණ වූ අවස්ථාවල ජනතාවට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා පෙන්නුම් කරන ඡායාරූප/ පුවත්පත් වාර්තා
- පොදු සේවා කාර්යක්ෂම ව සැපයීම නිසා ජනතාවට සහන සැලසුණු අවස්ථා පිළිබඳ පුවත්පත් වාර්තා / ඡායාරූප (උදාහරණ:- රෝහල් කාර්ය මණ්ඩලවල කාර්යක්ෂමතාව නිසා රෝගීන්ගේ ජීවිත ආරක්ෂා වූ අවස්ථාවක් / හදිසි ආපදා අවස්ථාවල දී පොදු සේවා මඟින් සහන සැලසූ අවස්ථා පිළිබඳ තොරතුරු වාර්තා /ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පාඩමට අදාළ විෂය කරුණු සාධනය වූවා දැයි මැන බැලීමට සුදුසු නිර්ණායක මත ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.1.4 පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ පුරවැසි අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ දැනුම්වත් ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි.**

**ඉගෙනුම් පල**

- පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් පුරවැසි අයිතිවාසිකම් හා යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පොදු සේවාවලට සම්බන්ධ පුරවැසි යුතුකම් ඉටු කිරීම කාර්යක්ෂම ව සේවා සැපයීමට ආධාර වන බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)
(එක් එක් සේවාවට අදාළ ව වෙන වෙන ම නිදසුන් සහිත ව පැහැදිලි කරන්න)

- පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ පුරවැසි අයිතිවාසිකම්

  උදාහරණ: පොදු සේවා ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය
  - පොදු සේවා ආරක්ෂා කිරීමේ අයිතිය
  - ගුණාත්මක තත්ත්වයෙන් උසස් පොදු සේවා භාවිත කිරීමේ අයිතිය
- පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම හා සම්බන්ධ පුරවැසි යුතුකම් හා වගකීම්
  - සේවා අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කිරීම
  - සේවා සඳහා ගෙවීම් කලට වේලාවට සිදු කිරිම
  - සේවා සම්බන්ධ දේපළ සුරැකීම
  - පොදු සේවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ යහපත් ආකල්පවලින් යුක්ත ව කටයුතු කිරීම
- පොදු සේවා පරිහරණය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් ඉටු කිරීම එහි කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීමට හේතු වන බව

**ගුණාත්මක යෙදවුම්**

- පොදු සේවා සම්බන්ධ යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරන පුවත්පත් දැන්වීම් / බිල්පත් මඟින් කරනු ලබන ඉල්ලීම්
  (උදාහරණ:- ජල බිල්, විදුලි බිල්, දුරකථන බිල් ගෙවිය යුතු කාල සීමාව සඳහන් කර තිබීම)
- පොදු සේවාවලට සම්බන්ධ යුතුකම් හා වගකීම් ඉටු නොකිරීම නිසා එම ආයතනවලට සිදු වන පාඩු දැක්වෙන පුවත්පත් වාර්තා
  (උදාහරණ:- විදුලිය අනවසරයෙන් ලබා ගැනීම නිසා සිදු වන පාඩු)
- පොදු සේවා අයථා ලෙස ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වරදකරුවන් වූ අයට දඬුවම් නියම වූ අවස්ථා දැක්වෙන වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- කණ්ඩායම් පැවරුම්/ තොරතුරු ගවේෂණය වැනි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිත කරමින් අදාළ විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර, නිර්ණායක පදනම් කර ගෙන අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය පිළිබඳ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම් 8.1

**නිපුණතාව** 8.1 • ජන ජීවිතයේ යහපත පිණිස පවත්නා පොදු සේවා ඵලදායි ව හා නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 8.1.1 • පොදු සේවා හඳුනා ගෙන එහි අවශ්‍යතාව හා කාලීන වැදගත්කම විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල**

- පොදු සේවා හඳුන්වයි.
- පොදු සේවාවල අවශ්‍යතාව පැහැදිලි කරයි.
- පොදු සේවාවල කාලීන වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම** - "පොදු සේවා හඳුනා ගනිමු "

**කාලය** - මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** -

- මඟී බස් රථයක්/ විදුලි බලාගාරයක ඡායාරූපයක්/ ජල කරාමයකින් ජලය ලබා ගන්නා අවස්ථාවක්/ රෝහලකින් ප්‍රතිකාර ලබන රෝගීහු/ පාසල් පන්ති කාමරයක ඉගෙනුම ලබන ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ (මේවා අතුරින් පහසු ඡායාරූප හෝ වීඩියෝ දර්ශන හෝ කිහිපයක් සපයා ගන්න)
- ඇමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**

- ගුණාත්මක යෙදවුම් යටතේ දක්වා ඇති ඡායාරූප/ වීඩියෝ දර්ශන කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න. ඒවා හඳුනා ගැනීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කරන්න.
- අද දින උදෑසන සිට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ප්‍රයෝජනයට ගත් පොදු සේවා පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම සාකච්ඡා ඇසුරින් පොදු සේවා හා ඒවායේ අවශ්‍යතාව හඳුනා ගැනීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර II**

- පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- අමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකාව එක් එක් කණ්ඩායමට සපයන්න.
- කාර්යය නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- කාර්යය නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

(මිනිත්තු 20)

**පියවර III**

- ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබා දෙමින් සමාලෝචනයක යෙදෙන්න.
- ඇගයීම් නිර්ණායක පදනම් කරගෙන තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

(මිනිත්තු 10)

ඇගයීම් නිර්ණායක -
- පොදු සේවා නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- පොදු සේවාවල අවශ්‍යතාව පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- පොදු සේවා අක්‍රිය වන අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පොදු සේවා අක්‍රිය වීම නිසා මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව අන් අය දැනුම්වත් කරයි.
- සහයෝගයෙන් හා උනන්දුවෙන් යුතු ව කණ්ඩායම් වැඩෙහි නිරත වෙයි.

ඇමුණුම 01

කාර්ය පත්‍රිකාව

- කණ්ඩායමේ සාමාජිකයන් සමඟ සාකච්ඡා කරමින් වගු සටහන සම්පූර්ණ කරන්න.
- ඔබ කණ්ඩායම විසින් සම්පූර්ණ කරන ලද වගුවේ සඳහන් තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

| පුරවැසියන් වෙත සැපයෙන පොදු සේවා | එම සේවා අක්‍රිය වන අවස්ථාවලට නිදසුන් | සේවා අක්‍රිය වීම නිසා ජනතාවට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා | එම සේවා අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග (රජය/ පුරවැසියන් විසින්) |
|---|---|---|---|
| ජල සම්පාදනය | | | |
| විදුලිය බලය | | | |
| ප්‍රවාහණය | | | |
| සෞඛ්‍ය සේවා | | | |

## 8.2 ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය

නිදහස, සමානාත්මතාව බහුතර මතයට ගරු කිරීම ආදි ලක්ෂණවලින් සමන්විත ජන සමාජයක් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස හැඳින්විය හැකි ය. එවැනි ජන සමාජයක පැවැත්ම සහතික කිරීම සඳහා පුරවැසියන් තුළ ද ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. පවුලේ, පාසලේ මෙන් ම ජන සමාජයේ සාමාජිකයන් වශයෙන් ජීවත් වීමේ දී ඉහත ගුණාංග ඔවුන් තුළ ප්‍රගුණ කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහ පැවැත්ම සඳහා බෙහෙවින් දායක වේ. මෙම ගුණාංග වර්ධනය වන පරිදි මෙහි සඳහන් විෂය කරුණු අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව 8.2**

- ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි

**නිපුණතා මට්ටම**

8.2.1 තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලට අනුගත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි.**

**ඉගෙනුම් පල**

- පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ නම් කරයි.
- පවුල් ඒකකය තුළ පැවතිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පවුලේ යහපැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරයි.
- පවුල් ඒකකයේ සාමාජිකයකු ලෙස ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග වර්ධනය කර ගැනීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.
- පාසල් සමාජය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හඳුනා ගෙන ඒ පිළිබඳ විස්තර කරයි.
- පාසල් සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගවලට අනුගත වෙමින් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- තම පවුල තුළ හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ
  - සාකච්ඡා මඟින් නිවැරදි තීරණවලට එළඹීම

    පවුලේ සාමාන්‍ය කටයුතුවල දී මව, පියා, දරුවන්, වැඩිහිටියන් එක් ව සාකච්ඡා කර තීරණ ගැනීම

    උදාහරණ:- ආහාර වේල් සැකසීම<br>වැඩකටයුතු බෙදා ගැනීම<br>යුතුකම් ඉටු කිරීම

    පවුලේ විශේෂ කටයුතුවල දී පවුලේ සාමාජිකයන් සාකච්ඡා කර තීරණ ගැනීම

    උදාහරණ:- විවාහ කටයුතු<br>ඉඩමක් මිල දී ගැනීම<br>නිවසක් තැනීම<br>උත්සව කටයුත්තක් සංවිධානය
  - අන්‍ය මත ඉවසීම
    - පවුලේ කටයුතුවල දී පවුලේ සාමාජිකයන්ගේ හා හිතවතුන්ගේ අදහස් විමසීම හා තනි මතයට කටයුතු නොකිරීම
    - තම මතය තහවුරු කර ගැනීමට අන් මත ඉවසීම හා විමසීම වැදගත් වීම
    - අන් අයට සවන් දීමේ වැදගත්කම
    - අන්‍ය මත ඉවසීම මඟින් අන් අයට ගෞරව කිරීමට යොමු වීම
    - අන්‍ය මත ඉවසීම මඟින් බහුතර මතයට ගරු කිරීම

- පවුලේ කටයුතුවල දී සියලු සාමාජිකයන්ගේ කැමැත්ත සලකා බලා එකඟ වීම හා බහුතර කැමැත්තට ගරු කිරීම මඟින් පවුල තුළ සුහදතාව වර්ධනය වීම

- නායකත්වයට ගරු කිරීම
    - පවුල තුළ දෙමාපියන් , වැඩිහිටියන් නායකත්වයෙහි ලා සැලකීම, ඔවුන්ගේ උපදෙස්, මඟපෙන්වීම් දරුවන් විසින් ලබා ගැනීම, පවුලේ කටයුතුවලට අනුගාමිකයන් ලෙස සහාය වීම, පවුලේ නායකත්වයට ගරු කරමින් පවුලේ දියුණුවට මෙන් ම සමාජ දියුණුවට දායක වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
    - පවුලේ සෑම කටයුත්තක දී ම පවුල තුළ සහයෝගය වර්ධනය වන ආකාරයට සියලු ම දෙනා දායක වෙමින් කටයුතු කිරීම

මේ ආකාරයෙන් පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමග සාකච්ඡා කරන්න. එය පවුලේ සුරක්ෂිතතා ව හා දියුණුවට හේතු වන ආකාරය පැහැදිලි කරන්න.

- **පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්‍ෂණ**
    - සාකච්ඡා මඟින් නිවැරදි තීරණවලට එළඹීම
    - පාසල තුළ පවතින නීතිරීති හා සම්ප්‍රදාය පිළිගෙන ආරක්‍ෂා කරමින් නිවැරදි තීරණ ගැනීම
    - පාසලේ කටයුතු සම්බන්ධ ව තීරණ ගැනීමේ දී විදුහල්පතිතුමා විසින් අනිකුත් සහාය නිලධාරීන්, ගුරු මහත්ම-මහත්මීන්, ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, දෙමාපියන් ආදි නියෝජනයන් සලකා බලමින් ඔවුන්ගේ මත හා අදහස් ද විමසමින් තීරණ ගැනීම
    - පාසලේ විශේෂ කටයුතුවල දී හා උත්සව අවස්ථාවල දී පාසල් ප්‍රජාව සමඟ සාකච්ඡා කර තීරණ ගැනීම
    - අන්‍ය මත ඉවසීම
    පාසල් කටයුතුවල දී ගුරු, ශිෂ්‍ය, දෙමවුපිය, ආදින්ගේ අදහස් පාසලේ කළමනාකරණය මඟින් සලකා බැලීම, එමඟින් පාසලේ අන් අයට සවන් දීමේ වැදගත්කම තහවුරු කිරීම, අන්‍ය මත ඉවසීම මඟින් අන් අයට ගෞරව කිරීමට යොමු වීම, මෙමඟින් පාසලට ආදර්ශයක් සැපයීමට හැකි වීම
    - බහුතර කැමැත්ත, මතය විමසීම හා එකඟ වීම
    පාසල් අධ්‍යාපන කටයුතු, පරිපාලන කටයුතු, සමිති සමාගම් කටයුතුවල දී බහුතර කැමැත්ත මත එකඟ වී කටයුතු කිරීම මඟින් පාසලේ ප්‍රජාතාන්ත්‍රික පරිසරයක් නිර්මාණය වීම
    - නායකත්වයට ගරු කිරීම
    පාසලේ විදුහල්පතිතුමාගේ නායකත්වයට ගරු කරමින් අන් අය අනුගාමිකයන් ලෙස කටයුතු කරමින් පාසලේ අභිවෘද්ධියට යොමු වීම
    - සහයෝගයෙන් කටයුතු කිරිම
    පාසල් පරිශ්‍රයේ පරිපාලනය, ගුරු මණ්ඩලය, ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, දෙමවුපියන්, ආදි ශිෂ්‍යයන්ගේ සහාය ලබා ගෙන පාසලේ දියුණුවට කටයුතු කිරීම්
    පාසල් පරිසරය තුළ දක්නට ලැබෙන මෙවැනි ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කර එය පාසලේ දියුණුවට යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පවුලක සාමාජිකයන් එදිනෙදා කටයුතුවල දී උදවු උපකාර කරන අවස්ථා දක්වෙන චිත්‍ර /ඡායාරූප
- පාසල් සමාජය තුළ පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ විදහා දක්වෙන චිත්‍ර / ඡායාරූප හෝ රූප සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- භූමිකා රංගන/ ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථා ඇසුරින් අදාළ විෂය කරුණු අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර, නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.2.2 ළමා අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 03 යි.**

**ඉගෙනුම් පල**

- ළමා අයිතිවාසිකම් පැහැදිලි කරයි.
- ළමා අයිතිවාසිකම් නිසි පරිදි භුක්ති විඳීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ළමා අයිතිවාසිකම් භුක්ති විඳීම ළමා සංවර්ධනයට හේතු වන ආකාරය විස්තර කරයි.
- ළමා අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතනවල කාර්යභාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ළමා අයිතිවාසිකම් හැඳින්වීම
  - 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය එක්සත් ජාතීන් විසින් එළිදැක්වීම
  - ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ පුද්ගලයෝ ළමයින් ලෙස පිළිගැනෙති. එමඟින් මේ වයස් සීමාවේ පසු වන ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොර සෑම ළමයකුට ම හිමි වන අයිතිවාසිකම් ළමා අයිතිවාසිකම් ලෙස දක්වා ඇත.
  - රටක අනාගත සම්පත වන දරුවෝ මාපියන්ට ද උතුම් වස්තුවකි.
  - දරුවන් පෝෂණය, රැකබලාගැනීම, අධ්‍යාපනය ලබා දීම, සංවර්ධනය වීමට අවස්ථාව ලබා දීම වැඩිහිටියන්ගේ යුතුකම වේ.
- ළමයකුට හිමි වන අයිතිවාසිකම් පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ වර්ග කර දැක්විය හැකි ය.
  - ආරක්ෂාවට ඇති අයිතිය
  - සහභාගිත්වයට ඇති අයිතිය
  - සංවර්ධනයට ඇති අයිතිය
  - පැවැත්මට ඇති අයිතිය
- ළමා අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්

  උදාහරණ කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| අයිතිවාසිකම් | යුතුකම් |
|---|---|
| අධ්‍යාපනය ලැබීම | හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම<br>ගුරුවරුන්ට ගෞරව කිරීම<br>පාසලේ විනය, නීතිරීති හා සම්ප්‍රදාය ආරක්ෂා කිරීම |
| සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම | පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ ව දැනුම්වත් වීම<br>යහපත් සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීම<br>සෞඛ්‍ය පුරුදු පිළිබඳ ව අන් අය දැනුම්වත් කිරීම |

| අයිතිවාසිකම් | යුතුකම් |
|---|---|
| සමාජ සුරක්ෂිතාවෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ අයිතිය | සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් දායක වීම<br>සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් අන් අය දැනුම්වත් කිරීම |
| ආගමික විශ්වාසයේ නිදහස | අන් අයගේ ආගම්වලට ගරු කිරීම<br>ආගමානුකූල යහපත් දිවි පැවැත්ම |

- ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතන
    - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව
    - ශ්‍රී ලංකා පොලිසිය
    - ළමා හා කාන්තා කාර්යාංශය
    - ස්වේච්ඡා සංවිධාන
  - අන්තර්ජාතික සංවිධාන (උදාහරණ: UNICEF)

**ගුණාත්මක යෙදවුම්**

"සාමය උදෙසා අයිතීන් සුරකිමු" කියවීම් පොත

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

ළමයින් තම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කරන අවස්ථා දැක්වෙන ඡායාරූප

ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතනවලින් ඉටු වන සේවා දැක්වෙන ඡායාරූප/ පුවත්පත් වාර්තා/වීඩියෝ දර්ශන

"ලෝක ළමා දිනය" වෙනුවෙන් පුවත්පත්වල පළ වූ ලිපි/ ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ළමා අයිතිවාසිකම් භුක්ති විඳීම, ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීම පිළිබඳ නිපුණතා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ වර්ධනය වීම පිළිබඳ මැන බැලීම සඳහා සුදුසු නිර්ණායක මූලික කර ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.2.3 ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පැවැත්ම සහතික වන ආකාරයෙන් චිත්තවේග හසුරුවා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි.**

**ඉගෙනුම් පල**

- පුද්ගලයා තුළ ඇති වන විවිධ චිත්තවේගී ස්වභාවයන් විස්තර කරයි.
- චිත්තවේග පුද්ගල හැසිරීම කෙරෙහි විවිධාකාරයෙන් බලපාන ආකාරය පැහැදිලි කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු වශයෙන් චිත්තවේග සුභවාදී ව හසුරුවා ගැනීම පුද්ගල ජීවිතයට හා සමාජ යහපතට හේතු වන බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- විවිධ චිත්තවේග
  - දෛනික ජීවිතයේ දී විවිධ චිත්තවේග ඇති වේ. ඒ අනුව විවිධ හැසිරීම් ස්වභාව ඉස්මතු වේ.
  - සතුට, දුක, බිය, කෝපය, ආදරය ආදි හැඟීම් ලෙසින් විවිධ චිත්තවේග ප්‍රකාශ වේ.
- චිත්තවේග අනුව හැසිරීම් රටා විවිධ වීම

  සතුට - ඔල්වරසන් දීම, සිනාසීම, නැටීම, සතුටු කඳුළු

  දුක - හැඬීම, කෑගැසීම, ඇස් රතු වීම, දහඩිය දැමීම

  කෝපය - කෑගැසීම, හැඬීම, වෙවුලීම, මුනිවත රැකීම

  බිය - ශරීරය වෙවුලීම, කෑගැසීම, ඇස් ලොකු වීම, කථා කිරීමට අපහසු වීම

- **චිත්තවේගවල ප්‍රතිඵල ලෙස**

  සතුට ——— ප්‍රබෝධජනක බව, සක්‍රිය බව, සැහැල්ලු බව,

  දුක ——— උදාසීන බව, කලකිරීම

- චිත්තවේග සුභවාදී ව හසුරුවා ගැනීමේ වැදගත්කම
  - අයහපත් චිත්තවේග තත්ත්වයක් දිගින් දිගට ම පැවතීම මගින් පුද්ගලයා කායික, මානසික හා සමාජීය වශයෙන් පිරිහීමට ලක් වන බැවින් අයහපත් චිත්තවේගී තත්ත්ව සමනය සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කිරීම වැදගත් වේ
  - පුද්ගලයා තුළ හටගන්නා චිත්තවේග මගහැරීම අපහසු වන බැවින් එය හිතකර අන්දමින් හසුරුවා ගැනීමට ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය
  - අයහපත් චිත්තවේග සමනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

    උදාහරණ:-
    - මනස සන්සුන් කිරීමේ අභ්‍යාස
    - සමීප මිතුරන් සමඟ සාකච්ඡා කිරීම
    - අයහපත් චිත්තවේග හටගන්නා පුද්ගල හා පරිසර තත්ත්ව වෙනස් කිරීම
    - නිර්මාණකරණය සඳහා යොමු වීම

- සෞන්දර්ය ක්‍රියාකාරකම්වල නිරත වීම
- ක්‍රීඩා කටයුතුවල හා ශාරීරික ව්‍යායාම්වල යෙදීම
- පරිසර වින්දනයට යොමුවීම

**ගුණාත්මක යෙදවුම්**

මුහුණේ ඉරියව්වලින් විවිධ චිත්තවේග පෙන්නුම් කරන චිත්‍ර/ ඡායාරූප/ වීඩියෝ දර්ශන
චිත්තවේග පාලනයෙන් තොර ව ක්‍රියා කිරීම නිසා අයහපත් ප්‍රතිඵල ඇති වූ අවස්ථා පිළිබඳ වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- චිත්තවේග මනා ලෙස හසුරුවා ගැනීමේ ශක්තිය ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ වර්ධනය කර ගැනීමට සුදුසු ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම භාවිත කර, නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.2.4 නායකත්වයේ අවශ්‍යතාව හඳුනා ගනිමින් නායකත්ව ගුණාංග ප්‍රගුණ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි.**

**ඉගෙනුම් පල**

- නායකත්වය යන්න කෙටියෙන් පැහැදිලි කරයි.
- සමාජයේ යහපැවැත්ම සඳහා යහගුණයෙන් යුතු නායකත්වයේ අවශ්‍යතාව පිළිබඳ විස්තර කරයි.
- නායකත්වය තුළ පැවතිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග නම් කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සමාජයේ යහපැවැත්ම සඳහා අනුගාමිකයකු ලෙස වර්ධනය කරගත යුතු ගුණාංග පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- නායකත්වය යන්න හැඳින්වීම
  පවුල හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ සමූහයක් හෝ පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා කණ්ඩායමක් ලෙස මෙහෙයවීම නායකත්වය වේ.
- සමාජයේ යහපැවැත්ම සඳහා යහගුණයෙන් යුතු නායකත්වයේ අවශ්‍යතාව
  උදාහරණ: ආදර්ශවත් නායකත්වය
- සමාජය තුළ නායකත්වය දැකිය හැකි අවස්ථා
  පවුල තුළ - දෙමාපියෝ / වැඩිහිටි දරුවෝ
  පාසල තුළ - විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති/ අංශ ප්‍රධානවරු/ විෂය ප්‍රධානවරු/ පන්තිභාර ගුරුවරු/ ශිෂ්‍ය නායකයෝ/ පන්ති නායකයෝ/ ක්‍රීඩා නායකයෝ/ පාසල් සංවර්ධන සමිති නායකයෝ/ කළමනාකරණ කමිටු
  සමාජය තුළ - ආගමික නායකයෝ/ ප්‍රජා නායකයෝ/ දේශපාලන නායකයෝ/ ආයතන ප්‍රධානවරු/ ස්වේච්ඡා සංවිධාන නායකයෝ
- සමාජය තුළ විවිධ නායකත්ව ශෛලීන් දක්නට ලැබේ
  උදාහරණ: - ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝ
  - ඒකාධිපති නායකයෝ
- නායකත්වයේ අවශ්‍යතාව
  - යම් ජන කණ්ඩායමක අපේක්ෂණ, පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා එය මෙහෙයවීමට නායකත්වයක් අවශ්‍ය වීම
  - තමා තමාට ම නායකයකු වීමේ අවශ්‍යතාව
  - පුද්ගල කණ්ඩායම් අතර පවතින සබඳතා මඟින් පොදු අරමුණක් ඉටුකර ගැනීම

ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංගවලට නිදසුන්

- අන්‍ය මත ඉවසීම
- ආත්ම විශ්වාසය
- ස්ථිරසාර බව

- සවන් දීම
- සමානාත්මතාව
- මිත්‍රශීලී බව
- අන් අයට උදවු කිරීම
- පක්ෂග්‍රාහී නොවීම
- අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම
- දුර දක්නා නුවණ
- කැප වීම
- නිවැරදි තීරණ ගැනීම
- සිහිනුවණින් කටයුතු කිරීම
- නිර්මාණශීලී බව
- මානව හිතවාදී බව
- අවංකකම

- ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම
  උදාහරණ: සමාජ යහපැවැත්ම / සමාජ සුභසිද්ධිය
- නායකත්වය හා අනුගාමිකත්වය
  - නායකයා කණ්ඩායම මෙහෙයවන්නා ය. අනුගාමිකයා යනු නායකත්වයට අනුව කටයුතු කරන්නාය.
  - නායකයා කණ්ඩායම මෙහෙයවන විට ඔහු කෙරෙහි විශ්වාසයෙන් යුතු ව කටයුතු කිරීමට අනුගාමිකයා සූදානම් විය යුතු ය.
  - නායකයා නිවැරදි අරමුණක් කරා මෙහෙයවීම, පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් තොර ව කටයුතු කිරීම අනුගාමිකයකු සතු යුතුකමකි.
  - හොඳ නායකයකු වීමට නම් යහපත් නායකයකු යටතේ අනුගාමිකයකු ලෙස කටයුතු කිරීම වැදගත් වේ.
  - නායකයා හා අනුගාමිකයා අන්‍යෝන්‍ය වශයෙන් වගකීමෙන් බැඳී සිටීම

**ගුණාත්මක යෙදවුම්**

ලෝක ප්‍රකට ශ්‍රේෂ්ඨ නායකයන්ගේ චරිත කථා / චිත්‍රපට / වීඩියෝ දර්ශන / නාට්‍ය
විවිධ ආගම්වල නායකත්වය පිළිබඳ දක්නට ලැබෙන චරිත කථා / සිද්ධි/ ජාතක කථා
අවට ප්‍රදේශයේ සිටිනා ශ්‍රේෂ්ඨ නායක චරිත පිළිබඳ විස්තර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විවිධ ශ්‍රේෂ්ඨ චරිත ආදිය ඇසුරු කරගෙන ඒ මඟින් ඉගෙනුම් අවස්ථා ඇති කර, නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.2.5 ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අවශ්‍ය ගුණාංග වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි.**

**ඉගෙනුම් පල**

- ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග පැහැදිලි කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතු වන බව ප්‍රකාශ කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම යනු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පුරුදු බවට පත් කර ගෙන සමාජය තුළ යහපත් පුරවැසියකු ලෙස කටයුතු කිරීම යි.

- ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මකට අදාළ ගුණාංග
  - අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම
  - නිවැරදි බහුතර මතයට ගරු කිරීම
  - තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීම
  - විනිවිද භාවයකින් යුතු ව කටයුතු කිරීම
  - නීතිගරුක වීම
  - අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම
  - විවිධ මත ඉවසීම
  - සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම
  - ස්වයං විනයකින් යුතු ව කටයුතු කිරීම
  - අවංක භාවය
  - සමානාත්මතාව

- ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතු වන ආකාරය
  - ජන සමාජය තුළ සුහදතාව වර්ධනය වීම
    - සැම ජන කණ්ඩායමක් ම සම සේ සැලකීම හා ගෞරව කිරීම නිසා අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය වීම
    - තම අවශ්‍යතා අපේක්ෂිත මට්ටමින් ඉටු වීම නිසා මිනිසුන් තෘප්තිමත් වීම
    - සැම කටයුත්තකට ම සැමගේ දායකත්වය හෝ නියෝජනය හෝ ලැබීමට හැකි වීම
  - ගැටුම් අවම වූ සමාජයක් බිහි වීම
    - බහුතර මතයට ගරු කිරීම
    - බහුතර මතය මෙන් ම සුළු ජන නියෝජනය සලකා බැලීම
    - සැම ජනවර්ගයකට මෙන්ම සංස්කෘතිවලට ගෞරව කිරීම
  - නීතිගරුක ජන සමාජයක් බිහි වීම
    - සැම පුරවැසියකු ම නීතිගරුක ව කටයුතු කිරීම, නීතිය උත්තරීතර කොට සැලකීම, අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම ආදිය මඟින් නීතිගරුක ජන සමාජයක් බිහි වීම
  - සාමකාමී සමාජ ක්‍රමයක් බිහි වීම
    - නීතිගරුක වීම, අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම, සමානාත්මතා මූලධර්මය මත කටයුතු කිරීමෙන් සාමකාමී සමාජ ක්‍රමයක් බිහි වීම
  - සියලු දෙනාගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම
    - සැම පුරවැසියකු ම තම අයිතිවාසිකම් හා යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම මඟින් අයිතිවාසිකම් ආරක්ෂා වීම

**ගුණාත්මක යෙදවුම්**

සමාජ ජීවිතයේ දී ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ඉස්මතු වන අවස්ථා දැක්වෙන පුවත්පත් වාර්තා/ ඡායාරූප

උදාහරණ:- සාකච්ඡා මඟින් ගැටලු විසඳාගත් අවස්ථාවක්

ශ්‍රමදාන අවස්ථාවක්/ තම යුතුකම් ඉටු කරන අවස්ථාවක්

උදාහරණ:- දෙමාපියන්/ ගුරුවරුන්/ වැඩිහිටියන් ලෙස

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිද්ධි අධ්‍යයන/ සාකච්ඡා වැනි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම භාවිත කර සුදුසු නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම් 8.2

**නිපුණතාව** 8.2 • ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 8.2.1 • තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලට අනුගත වෙයි.

**ඉගෙනුම් පල**

- පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ නම් කරයි.
- පවුල් ඒකකය තුළ පැවතිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පවුලේ යහ පැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරයි.
- පවුල් ඒකකයේ සාමාජිකයන් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග වර්ධනය කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි.
- පාසල් සමාජය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ විස්තර කරයි.
- පාසල් සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගවලට අනුගත වෙමින් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - "සහයෝගයෙන් වැඩ කරමු "

**කාලය** - මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** -

- ඇමුණුම 01හි සඳහන් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 02හි සඳහන් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 03හි සඳහන් කතාවේ ඡායා පිටපත් (කණ්ඩායමට එක බැගින් වත් සපයා ගන්න)
- ඇමුණුම 04හි සඳහන් කතාවේ ඡායා පිටපත් (කණ්ඩායමට එක බැගින් වත් සපයා ගන්න)

**ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර I -

- පන්ති නායක/ විෂය නායක/ සමිතියක සභාපති ධුරයට නම් දෙකක් යෝජනා වූ විට වැඩි දෙනාගේ කැමැත්ත මත එම නිලයට කෙනකු තෝරා ගත් අවස්ථා පිළිබඳ මතක් කරමින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- වැඩි දෙනාගේ කැමැත්ත මත තීරණ ගැනීම
- අන් අයගේ අදහස් ගරු කිරීම
- සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ බව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න

(මිනිත්තු 10)

පියවර II - • පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

- කණ්ඩායම් 1ට හා 2ට ඇමුණුම 3හි සඳහන් කතාවේ ඡායා පිටපත බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම් අංක 3ට හා 4ට ඇමුණුම 4හි සඳහන් කතා පිටපත බැගින් ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ පරිදි කාර්ය පත්‍රිකාව බැගින් ලබා දෙන්න.
- කාර්ය නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම සකස් කළ වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 20)

පියවර III - • වැදගත් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
පහත දැක්වෙන නිර්ණායක මත ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.
(මිනිත්තු 10)

**ඇගයීම් නිර්ණායක**

- පවුල හා පාසල තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හඳුනා ගෙන නම් කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම සමාජයේ යහපතට හේතු වන බව පැහැදිලි කරයි.
- පවුලේ හා පාසලේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ අනුගමනය කිරීමෙන් අත්වන වාසිදායක ප්‍රතිඵල පිළිබඳ ව අන් අය දැනුම්වත් කරයි.
- කණ්ඩායම් සාකච්ඡාව සඳහා උනන්දුවෙන් සහභාගි වෙයි.

**ඇමුණුම 01**

කාර්ය පත්‍රිකාව (කණ්ඩායම් අංක 01 හා 02 සඳහා)

- ඔබට සපයා ඇති "සහයෝගයෙන් වැඩ කරමු" සංවාදය හොඳින් කියවන්න.
- එම කතාවෙන් ඉස්මතු වන, පාසල තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ නම් කරන්න.
- ඔබ නම් කළ එක් එක් ලක්ෂණය ඉස්මතු වන අවස්ථාවලට කතාව අනුසාරයෙන් නිදසුන් සපයන්න.
- ඔබ වාර්තා කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 02**

කාර්ය පත්‍රිකාව (කණ්ඩායම් අංක 03 හා 04 සඳහා)

- ඔබට සපයා ඇති "අපේ කැමැත්ත ඉටු වන දා" සංවාදය හොඳින් කියවන්න.
- එම කතාවෙන් ඉස්මතු වන පවුල තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ නම් කරන්න.
- ඔබ නම් කළ එක් එක් ලක්ෂණය ඉස්මතු වන අවස්ථාවලට කතාව අනුසාරයෙන් නිදසුන් සපයන්න.
- ඔබ වාර්තා කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 3 (කණ්ඩායම් අංක 1 හා 2 සඳහා)**

**''සහයෝගයෙන් වැඩ කරමු''**

එදින උදැසන පන්ති භාර ගුරුතුමිය පන්තියට පැමිණි අවස්ථාවේ පන්ති නායක චරිත් හොඳ යෝජනාවක් කළා. පන්තියට භාර වූ බිම් කොටස අලංකාර කිරීමේ අවශ්‍යතාව ගැන යි, ඔහු ගුරුතුමිය එක්ක කතා කළේ. ගුරුතුමිය චරිත්ගේ යෝජනාව සතුටෙන් අනුමත කළා.

''චරිත් හැම දා ම හොඳ වැඩ කරන්න, හොඳ යෝජනා ගේනවා. අපි ඔය වැඩේ කරමු''

''චරිත් ම ළමයි එක්ක කතා කර ගන්නකො'' මිස් කීවා.

''ඔයගොල්ලො මොන විදියට ද මේ බිම් කොටස අලංකාර කරන්න අදහස් කරන්නෙ'' චරිත් ළමයින්ගෙන් ඇහුවා.

''චරිත් අර සෝදගෙන යන තැන ගල් වැටියක් දාන්න ඕන''

''නැත්නම් එහෙම මොනව කළත් වැඩක් නෑ'' අමිල යෝජනා කළා.

''ඔව් ඔව් වැස්ස දවසට ඔතනින් ලොකු වතුර පාරක් එනවා. ගල් වැටියක් නම් දාන්න ම ඕනෙ'' සුදේශ් අමිලගේ අදහස ස්ථිර කළා.

''ගල් වැටිය දාල පහළින් පස් අරගෙන දාලා හෝදගෙන ගියපු ටික පුරවමු'' අමිල කීවේ හරි උනන්දුවෙන්.

''ඔව් ඒක හොඳ යි'' චරිත් ඒක අනුමත කළා.

''දැන් අපි මොනව ද මෙතන ලස්සණට වවන්නේ'' චරිත් ඇහුවා.

''මල් වවමු'' චාපා යෝජනා කළා.

''නෑ නෑ එළවලු ජාති වවමු'' ශ්‍යාමා කීවා

''නෑ නෑ මල් වවමු, මල් තමයි ඔතනට ලස්සණ''

''හොඳ මල් ජාති ටිකක් වැව්වා ම ඔතන ලස්සනට තියේවි'' චාපා නැවත එයාගේ අදහස ඉදිරිපත් කළා.

''අනේ එළවුළු දාමු. අපිට කන්න ගෙනියන්නත් පුළුවන්'' ශ්‍යාමා කිවුවා.

''අනිත් අය මොක ද කියන්නෙ'' චරිත් ප්‍රශ්නෙ පන්තියේ යාළුවන්ට යොමු කළා.

''එළවුළු, එළවුළු වවමු''වැඩි දෙනකු අත් ඔසවමින් එය අනුමත කළා.

''චාපාට මොනව ද ගේන්න පුළුවන්'' චරිත් චාපාගෙන් ඇහුවා.

''මම මිරිස් පැළ ටිකක් ගේන්නම්. තව ඇට ජාති ටිකකුත් ගෙදර තිබුණා. මම බලන්නම්. හොඳ ජාති තිබුණොත් ගේන්නම්'' චාපා ද වැඩි දෙනාගේ අදහස අනුමත කළා.

''එහෙනම් හෙට ඉඳලා වැඩ පටන් ගනිමු''

චරිත් එහෙම කිවුවා ම කවුරුනුත් ඒකට එකඟ වුණා.

**ඇමුණුම 4 (කණ්ඩායම් අංක 3 හා 4 සඳහා)**

**''අපේ කැමැත්ත ඉටු වන දා''**

අගෝස්තු නිවාඩුවට චාරිකාවක් යනවා කියල තරුෂිගෙ තාත්තා කිවුවෙ මේ අවුරුද්ද පටන් ගනිද්දි ම යි. අගෝස්තු නිවාඩුවත් ළඟට ම ආපු නිසා එදා රෑ කෑම කාලා ඉවර වෙලා තාත්තාගෙන් ගමන ගැන අහන්න ඕනෑ කියලා තරුෂි හිතුවා. අම්මයි, තාත්තයි, සීයයි, අයියයි, මල්ලියි කට්ටිය ම ඒ වෙලාවෙ ගෙදර හිටිය නිසා තරුෂි තාත්තාගෙන් මේ ගැන ඇහුවා.

''තාත්තා කිවුවා නේද අගෝස්තු නිවාඩුවට චාරිකාවක් යනවා කියලා'', තරුෂි තාත්තාගෙන් ඇහුවා.

''ඔව් දුව'' තාත්තා කෙටි උත්තරයක් දුන්නා.

''දැන් කොහේ ද තාත්තා අපිව එක්කරගෙන යන්න හිතාගෙන ඉන්නෙ'' තරුෂි විමසුවා.

''අනුරාධපුරේ යන්න තමයි හිතාගෙන ඉන්නෙ'' තාත්තා එහෙම කිවුව ම තරුෂිට ලොකු සතුටක් දැනුණා

''නෑ නෑ මට නම් යන්න ඕන යාල වනෝද්‍යානය බලන්න. මම යන්න ම හිතාගෙන හිටියෙ එහේ. සත්තු බලන්නත් පුළුවන්. විනෝද වෙන්නත් පුළුවන්'' තරුෂිගෙ අයියා එක වර ම කිවුවා.

''නෑ අපි නම් කැමතියි අනුරාධපුරේ යන්න. මම ආස ම එහේ යන්න. අපි එහේ ගිහිනුත් නෑ. ඉතිහාසය පාඩම් උගන්නද්දි අපේ මිස් කිවුවා මේ පාඩම්වල තියෙන ගොඩක් දේවල් අනුරාධපුරේ ගියොත් දැක ගන්න පිළිවන් කියලා. මම එදා ඉඳලා හිතාගෙන ම හිටියෙ කොහොම හරි අනුරාධපුරේ යන්න ඕනෑ කියල'' මල්ලි දිගට ම කියාගෙන ගියා.

''මටත් හොඳයි අනුරාධපුරේ ගියොත්. වන්දනාමාන කර ගන්නත් පිළිවන්'' සීයත් මල්ලිගෙ කතාවට එකතු වුණා.

''ලොකු පුතේ ඔක්කොම කැමති නිසා අපි මේ නිවාඩුවට අනුරාධපුරේ යමු'' අම්මා අයියට කිවුවා.

''එහේ යනවා නම් මම එන්නේ නැහැ. මම ලොකු අම්මලාගෙ ගෙදර ඉන්නම්. අම්මල ගිහින් එන්න'' අයියා හිතුවක්කාර විදියට කිවුවා.

අයියා එහෙම කිවුවා ම මම හිතුව තාත්තාට තරහ යයි කියලා. ඒත් තාත්තා හිනා වෙලා අයියාට මෙහෙම කිවුවා.

''ලොකු පුතා, මේ කවුරුත් කැමති නිසා අපි අනුරාධපුරේ යමු. ආයෙ නිවාඩුවකට ඕනෙ නම් අපි යාල යමුකෝ'' ඒත් අයියා එක වර උත්තරයක් දුන්නේ නැහැ.

අනෙක් අය ගමන යන දිනය, නවතින්න තැන් වගේ විස්තර කතා කරන්න ගත්තා. අයියා ඒවාට සම්බන්ධ වුණේ නෑ. නිශ්ශබ්ද ව හිටියා.

''ලොකු පුතේ දැන් හරිනේ, මේ නිවාඩුවට අපි අනුරාධපුරේ යමු. මොකද කියන්නෙ'' තාත්තා අයියා ගෙන් ආයෙ මත් ඇහුවා. කවුරුනුත් අයියගේ මුහුණ දිහා බැලුවා.

තාත්තාගේ ඉල්ලීමට එකඟ වෙලා අයියා හා කිවුවා.

වැඩි දෙනෙකුගෙ කැමැත්ත ඉටු වුණා. කවුරුනුත් සතුටු වුණා.

## 8.3 බහුසංස්කෘතික ජන සමාජය

වත්මන් ජන සමාජය, විවිධ ජන වර්ගවලට අයත්, විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතා කරන, විවිධ සිරිත් විරිත් හා සම්ප්‍රදාය ගරු කරන සාමාජිකයන්ගෙන් සමන්විත වේ. එවන් ජන සමාජ බහුසංස්කෘතික ජන සමාජ ලෙස හඳුන්වයි.

එකිනෙකාගේ අයිතිවාසිකම් ගරු කිරීම, සමානාත්මතා මූලධර්මය මත පදනම් ව කටයුතු කිරීම, සහජීවනයෙන් යුතු ව කටයුතු කිරීම, අන්‍ය සංස්කෘතිවලට ගරු කිරීම, තම සංස්කෘතික අනන්‍යතාව රැක ගැනීම, බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සහතික කිරීම සඳහා පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු ගුණාංග සමූහයකට නිදසුන් වේ. ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ මෙම ගුණාංග වර්ධනය කිරීමට අවශ්‍ය අවකාශ සැලසෙන අයුරින් මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිපුණතාව 8.3**

- බහුසංස්කෘතික ජන සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම**

8.3.1 බහුසංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි**

**ඉගෙනුම් පල**

- බහුසංස්කෘතික ජන සමාජය යන්න අර්ථ දක්වයි.
- බහුසංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- බහුසංස්කෘතික ජන සමාජය හැඳින්වීම
  යම් ජන සමාජයක් තුළ වාර්ගික, ආගමික, භාෂා, කලා, ඇදහිලි හා විශ්වාස ආදි වශයෙන් විවිධත්වයක් සහිත සමාජ බහුසංස්කෘතික ජන සමාජයක් ලෙස හැඳින්වේ. වර්තමානයේ සංචාරක කටයුතු, රැකියා, අධ්‍යාපන කටයුතු, වෙළෙඳාම, සංවර්ධන ව්‍යාපෘති, ආදිය සඳහා සිදු වන මානව සංක්‍රමණ සංස්කෘතික විවිධත්වය සංකීර්ණ වීමට හේතු වී ඇත.
- බහුසංස්කෘතික ජන සමාජයක ලක්ෂණ
  - සමාජය විවිධ ජනවර්ගවලින් සමන්විත වීම
  - විවිධ ආගම් පැවතීම
  - විවිධ භාෂා භාවිත කිරීම
  - විවිධ සිරිත්-විරිත් සමාජගත ව පැවතීම
  - විවිධ සංස්කෘතික උරුමයන් පැවතීම

**ගුණාත්මක යෙදවුම්**

විවිධ සංස්කෘතික උත්සවවල චිත්‍ර හෝ පින්තූර

ශ්‍රී ලංකාවේ ජන වාර්ගික හා ආගමික සංයුතිය දක්වෙන ප්‍රස්තාර

විවිධ සංස්කෘතිවලට අයත් ආගමික සංකේත/ ආගමික සිද්ධස්ථාන ඇතුළත් පෝස්ටර්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- බහුසංස්කෘතික සමාජයක විවිධ අංග ලක්ෂණ දක්වෙන චිත්‍ර, පෝස්ටර්, ප්‍රස්තාර වැනි දෑ නිර්මාණය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න. ඒවා පන්තියට ඉදිරිපත් කිරීම හා සාකච්ඡා කිරීම මගින් දක්වන අදහස් සැලකිල්ලට ගනිමින් නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.3.2 සංස්කෘතික විවිධත්වය තුළ සමඟියෙන් හා සහජීවනයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලංකාව බහුසංස්කෘතික ජන සමාජයක් බව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා ජන සමාජයේ පවතින විවිධ සංස්කෘතිවලට අයත් සංස්කෘතික අංග පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- බහුසංස්කෘතික ජන සමාජයක සාමාජිකයකු ලෙස සහජීවනයෙන් යුතු ව ජීවත් වීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි.
- වෙනත් රටවල බහුසංස්කෘතික ලක්ෂණ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ශ්‍රී ලංකාවේ බහුසංස්කෘතික ජන සමාජයක් බිහිවීමට බලපෑ හේතු
  - භූගෝලීය පිහිටීම
  - සංක්‍රමණ
  - ආක්‍රමණ
  - වෙළෙඳාම
  - සංස්කෘතික සම්බන්ධතා
- ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය
  - විවිධ ජන වර්ග

    උදාහරණ: සිංහල, දෙමළ, යෝනක හා , මැලේ, බර්ගර් හා වෙනත් ජනවර්ග
  - විවිධ භාෂා

    උදාහරණ: සිංහල, දෙමළ, ඉංග්‍රීසි
  - විවිධ ආගම්

    උදාහරණ: බෞද්ධ, හින්දු, ඉස්ලාම්, රෝමානු කතෝලික/ ක්‍රිස්තියානි
- විවිධ සංස්කෘතික සම්ප්‍රදාය

  උදාහරණ: විවාහ සහ අවමංගල්‍ය චාරිත්‍ර
- විවිධ ජනවර්ග හා බැඳුණු සිරිත්විරිත්

  උදාහරණ: උපතට පෙර සිට මරණයෙන් පසු තෙක් අනුගමනය කරන සිරිත්-විරිත්
- විවිධ ආගම් හා බැඳුණු සිරිත්-විරිත්, සම්ප්‍රදාය ආගම් හා බැඳුණු උත්සව හා ඒවායේ වැදගත්කම

  උදාහරණ: බෞද්ධ - (වෙසක් උත්සවය, පොසොන් උත්සවය)

  හින්දු - (තෛපොංගල්, දීපාවලී)

  ඉස්ලාම් - (රාමලාන්, හජ්ජි)

  ක්‍රිස්තියානි - (නත්තල්, මහ සිකුරාදා)
- ශ්‍රී ලාංකික ජන සමාජය තුළ එක් එක් සංස්කෘතියෙහි අනන්‍යතාව තහවුරු වී තිබීම
  - විවිධ සංස්කෘතිවලට ගරු කිරීම

- විවිධත්වයෙහිලා සමගියෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම

  උදාහරණ: - එක ම ප්‍රදේශයක විවිධ ජන වර්ග හා විවිධ ආගම් අදහන අය ජීවත් වීම
  - විවිධ සංස්කෘතික කණ්ඩායම් සංස්කෘතික සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා

- බොහෝ රටවල බහුසංස්කෘතික ජන සමාජ පවතින බව

  උදාහරණ:- ඉන්දියාව
  ඇමරිකා එක්සත් ජනපදය
  කැනඩාව

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික සංයුතිය දැක්වෙන ප්‍රස්තාර
ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය දැක්වෙන ඡායාරූප
විවිධ ජන වර්ග හා බැඳුණු සිරිත්-විරිත් දැක්වෙන පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ශ්‍රී ලංකාව බහුසංස්කෘතික සමාජයක් බැවින්, එවැනි සමාජයක යහපැවැත්ම තහවුරු කෙරෙන නිපුණතා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ සංවර්ධනය වීම පිළිබඳ ව මැන බැලීමට සුදුසු නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.3.3 ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගියට හා තිරසර සාමය ගොඩනගා ගැනීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04 යි**

**ඉගෙනුම් පල**

- සාමකාමී ජන සමාජයක යහපැවැත්ම සඳහා අන්‍යෝන්‍ය අවබෝධය වැදගත් වන බව ප්‍රකාශ කරයි.
- බහුසංස්කෘතික ජන සමාජයක සංස්කෘතික සමෝධානය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.
- තම සංස්කෘතික අනන්‍යතාව රැකගනිමින් අන්‍ය සංස්කෘතිවලට ගරු කරමින් ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- බහුසංස්කෘතික ජන සමාජයක් තුළ තිරසර සාමය ගොඩනැගීමේ වැදගත්කම විස්තර කරයි.
- තිරසර සාමය ජාතික සංවර්ධනයට හේතු වන අයුරු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අන්‍යෝන්‍ය අවබෝධය නිසා ගැටුම් අවම වීම හා ජන කොටස් අතර සමගිය තහවුරු වීම
  - විවිධ සංස්කෘති අතර අන්‍යෝන්‍ය දැනුම්වත් භාවය සහ සුහදතාවය
- සංස්කෘතික විවිධත්වයෙහිලා තුළ රට සංවර්ධනය කර ගැනීමට එකමුතු ව කටයුතු කිරීම

  උදාහරණ:- සෑම සංස්කෘතික කණ්ඩායමකට ම අයත් ජනතාව ජාතිය ගොඩනැගීමේ (Nation building) පරමාභිලාෂයෙන් රටේ සංවර්ධනය සඳහා ශ්‍රමය කැප කිරීම
- සංස්කෘතික සමෝධානය ඇති කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

  උදාහරණ:- විවිධ සංස්කෘති පිළිබඳ දැනුම වර්ධනය කිරීම<br>විවිධ භාෂා හැකියා වර්ධනය<br>සංස්කෘතික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- භේදයකින් තොර ව ඵලදායි ආර්ථික කටයුතුවල යෙදෙමින් රට සංවර්ධනයට දායක වීම
  - ජනවර්ග, ආගම්, භාෂා භේදයෙන් තොර ව විවිධ රැකියාවල යෙදෙමින් රටේ සංවර්ධනයට දායක වීම
- සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම

  උදාහරණ:- අන්‍ය සංස්කෘතිවලට ගරු කිරීම<br>- සංස්කෘතික විවිධත්වය අගය කිරීම
- බහුසංස්කෘතික ජන සමාජය තුළ තිරසර සාමය ගොඩනැගීම
  - වර්තමානයේ බොහෝ රටවල බහුසංස්කෘතික ජන සමාජ පැවතීම
  - අන්‍ය සංස්කෘති පිළිබඳ අවබෝධයෙන් හා ගරුත්වයෙන් යුතුව කටයුතු කිරීම මඟින් තිරසර සාමයට දායක වන බව

- එකිනෙකා අතර එකමුතු බව, සහයෝගය, සහෝදරත්වය තිරසර සාමය ගොඩ නැඟීමට හේතු වන ආකාරය

**ගුණාත්මක යෙදවුම්**

විවිධ සංස්කෘතික කණ්ඩායම් එකමුතු ව කටයුතු කරන අවස්ථා දැක්වෙන චිත්‍ර, පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සංස්කෘතික සමෝධානය ඇති කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම්වල ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොදවා නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම් 8.3

**නිපුණතාව** 8.3 බහුසංස්කෘතික ජන සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම** 8.3.1 බහුසංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**ඉගෙනුම් පල**
- බහුසංස්කෘතික ජන සමාජය යන්න අර්ථ දක්වයි.
- බහුසංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - "විවිධත්වයෙහි එක්සත් බව දකිමු"

**කාලය** - මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** -
- ඇමුණුම 8.3.1.1 ශ්‍රී ලංකාවේ ජන වර්ග අනුව ජනගහන ප්‍රතිශතය
- ඇමුණුම 8.3.1.2 ශ්‍රී ලංකාවේ ආගම් අනුව ජනගහන ප්‍රතිශතය
- ඇමුණුම 8.3.1.3 සඳහන් කාර්යපත්‍රිකා

**ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I** - ශ්‍රී ලංකාවේ ආගම් හා ජනවර්ග අනුව ජනගහන ප්‍රතිශත දැක්වෙන ඇමුණුම 8.3.1.1 සහ 8.3.1.2 ඉදිරිපත් කර පාඩමට ප්‍රවේශ වන්න. බහුසංස්කෘතික සමාජයක ස්වරූපය පැහැදිලි කරමින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ අවධානය යොමු කර ගන්න.

(මිනිත්තු 10)

**පියවර II** -
- පංතියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 8.3.1.3 දැක්වෙන කාර්ය පත්‍රිකා අදාළ පරිදි කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 14)

**පියවර III**-
- නිම කරන ලද කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සියලු ම කණ්ඩායම්වලට අදහස් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
- අදාළ විෂය කරුණු පැහැදිලි වන සේ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 16)

**පහත දැක්වෙන නිර්ණායක මත ඇගයීම් හා තක්සේරුකරණය සිදු කරන්න**
- ශ්‍රී ලංකාව විවිධ ජන වර්ගවලින් සමන්විත රටක් බව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය පිළිබඳ අදහස් දක්වයි.
- කණ්ඩායම් වාර්තා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.
- ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් සාමූහික ව කටයුතු කරයි.

ඇමුණුම 8.3.1.1

**ශ්‍රී ලංකාවේ ජන වර්ග අනුව ජනගහන ප්‍රතිශතය**

| | |
|---|---|
| • සිංහල | 74% |
| • ශ්‍රී ලංකා දෙමළ | 12.6% |
| • යෝනක | 7.1% |
| • ඉන්දීය දෙමළ | 5.5% |
| • වෙනත් | 0.8% |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ජනසංගණන වාර්තාව - 2012

ඇමුණුම 8.3.1.2

**ශ්‍රී ලංකාවේ ආගම් අනුව ජනගහන ප්‍රතිශතය**

| | |
|---|---|
| • බෞද්ධ | 73.7% |
| • හින්දු | 10.9% |
| • ඉස්ලාම් | 7.6% |
| • ක්‍රිස්තියානි | 6.2% |
| • වෙනත් | 1.6% |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ජනසංගණන වාර්තාව - 2012

ඇමුණුම 8.3.1.3

කාර්ය පත්‍රිකාව - 1 කණ්ඩායම

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාව විවිධ ජන වර්ග සමන්විත රටක් බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකි.

කාර්ය පත්‍රිකාව - 2 කණ්ඩායම

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාව විවිධ ආගම් අදහන අයගෙන් සමන්විත රටක් බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකි.

කාර්ය පත්‍රිකාව - 3 කණ්ඩායම

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාව විවිධ භාෂා කථා කරන රටක් බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකි.

කාර්ය පත්‍රිකාව - 4 කණ්ඩායම

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාව විවිධ සිරිත් විරිත් අගයන ජන සමාජයක් සහිත රටක් බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකි.

කාර්ය පත්‍රිකාව - 5 කණ්ඩායම

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාවේ බහුසංස්කෘතික ජනසමාජයක් තුළ සියලු දෙනා ම එක්සත් ව කටයුතු කිරීමේ වැදගත්කම නිදසුන් මඟින් පැහැදිලි කිරීම යි.

## 8.4 කාලීන ගැටලු

ජන සමාජයේ සුරක්ෂිත පැවැත්මට ඇති ප්‍රබල ම අභියෝග ලෙස ස්වාභාවික විපත්, අනතුරු, අයහපත් ජීවන පුරුදු පෙන්වා දිය හැකි ය. පෘථිවි පරිසර පද්ධතිය තුළ විපත් ඇති වීම සාමාන්‍ය සංසිද්ධියක් වන අතර එය ස්වාභාවික පරිසර පද්ධතිවල තුලනයට හේතු වේ. එහෙත් මිනිසාගේ අපරීක්ෂාකාරී ක්‍රියාකාරකම් නිසා එකී විපත් වර්තමානයේ තීව්‍ර වීම පරිසරයේ මෙන් ම මිනිසාගේ පැවැත්මට ද තර්ජනයක් වී ඇත.

මෙම පරිච්ඡේදය මඟින් අනතුරු හා විපත් සිදු විය හැකි ආකාර හා ඒවා අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග, සහාය ලබාගත හැකි ආයතන, උපදෙස් පිළිපැදීමේ වැදගත්කම, තමන්ගේ හා අන් අයගේ ජීවිත ආරක්ෂා කර ගැනීම, අවස්ථෝචිත ව කටයුතු කිරීම, ආපදා කළමනාකරණය යන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. මීට අමතර ව අහිතකර පුරුදු, ඖෂධ භාවිතය, මාර්ග අනතුරු වළක්වා ගැනීම, රසායනික ද්‍රව්‍ය මඟින් සිදු වන අනතුරු වළක්වා ගැනීම පිළිබඳ අවධානය යොමු වී ඇත. එමෙන් ම දැරිය හැකි ජීවන රටාවකට අනුගත වෙමින් තිරසර සංවර්ධනයට දායක වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා අනාගත ශිෂ්‍ය පරපුර තුළ ගොඩනඟා, සුරක්ෂිත ජන සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව 8.4**

- ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම**

8.4.1 අනතුරු හා විපත් හඳුනා ගෙන ඒවා අවම කිරීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02 යි**

**ඉගෙනුම් පල**

- අනතුරු හා විපත් නම් කරයි.
- අනතුරු හා විපත් ඇති වීමට බලපාන හේතු පැහැදිලි කරයි.
- අනතුරු හා විපත්වලින් වන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි.
- අනතුරු වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.
- අනතුරුවල දී හා ආපදාවල දී සහාය ලබාගත හැකි ආයතන නම් කරයි.
- අනතුරුවල දී හා ආපදාවල දී සහාය ලබා දෙන ආයතනවල උපදෙස් පිළිපැදීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අනතුරු හා විපත් හඳුනා ගැනීම
- ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් හේතු කොටගෙන ඇති වන අනතුරු හා විපත්
- ස්වාභාවික විපත් හැඳින්වීම

  පෘථිවිය හා එහි අවට පරිසරයේ ඇති වන මිනිසාට මෙන් ම පරිසරයට ඔරොත්තු නොදෙන ස්වාභාවික තත්ත්ව ස්වාභාවික විපත් වශයෙන් සරල ව හැඳින්විය හැකි ය.

  උදාහරණඃ- භූමි කම්පා/ සුනාමි/ ගංවතුර/ කුණාටු

  ස්වාභාවික විපත් නිසා සිදු වන හානි

  - ජීවිත හානි
  - දේපොළ හානි
- ස්වාභාවික විපත් ඇති වීමට හා ඉන් සිදුවන හානි උත්සන්න වීමට බලපාන විවිධ මිනිස් ක්‍රියාකාරකම්

  උදාහරණඃ- වනාන්තර විනාශ කිරීම
  ගංගාවලින් වැලි ගොඩ දැමීම
  කොරල්පරවලට හානි සිදු කිරීම
  පතල් කැණීම
  අනිසි ලෙස පහත් බිම් ගොඩ කිරීම
  මුහුදු වෙරළෙන් වැලි ඉවත් කිරීම
  නොදිරන භාණ්ඩ අනිසි ලෙස බැහැර කිරීම
- අනතුරුවලින් හා විපත්වලින් සිදු වන හානි අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග
  - අනතුරු හා විපත් පිළිබඳ අදාළ ආයතන මඟින් කරනු ලබන දැනුම්වත් කිරීම් පිළිබඳ සැලකිලිමත් වීම හා දෙනු ලබන උපදෙස් පිළිපැදීම

- අනතුරු වැළැක්වීමට හා හානි අවම කිරීමට අදාළ ව සේවා සපයන ආයතනවලට ඒ පිළිබඳ ව දැනුම් දීම
- විපතට පත් වූවන් බේරා ගැනීම
- නිවැරදි ප්‍රථමාධාර ලබා දීම
- විපතට පත්වූවන් රෝහල් වෙත ඉක්මනින් රැගෙන යෑම
- විපත/ අනතුර පිළිබඳ ව රෝහල්වලට/ පොලීසියට දැනුම් දීම
- අනතුරට පත් වූවන් සම්බන්ධයෙන් මානුෂික ව ක්‍රියා කිරීම

- අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
- අනතුරු හා ආපදාවල දී සහය ලබාගත හැකි ආයතන
  - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, රෝහල, පොලීසිය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
  - වෙනත් ආයතන/ පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන හා සම්බන්ධ ගිනි නිවන ඒකක

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රී ලංකාවේ/ ලෝකයේ විවිධ රටවල සිදු වූ ස්වාභාවික විපත් හා ඒවායින් සිදු වූ හානි දැක්වෙන පුවත් වාර්තා / ඡායාරූප /වීඩියෝ දර්ශන
- මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ලෝකයේ විවිධ රටවල / ශ්‍රී ලංකාවේ සිදු වූ විපත් හා ඒ නිසා සිදු වූ හානි දැක්වෙන පුවත්පත් වාර්තා / ඡායාරූප /වීඩියෝ දර්ශන
- අනතුරු හා විපත්වල දී විවිධ ආයතන හා ඒවාට සම්බන්ධ නිලධාරීන් / සාමාන්‍ය ජනතාව ඉටු කරන සේවා දැක්වෙන පුවත්පත් වාර්තා /ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පැවරුම්/ කණ්ඩායම් ක්‍රියාකාරකම්/ගවේෂණ, ආදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යටතේ කරුණු අධ්‍යයනය කිරීමට යොමු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.4.2 අනතුරුවල දී හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- අනතුරු හා විපත් අවස්ථාවල දී තමන්ගේ හා අන්‍යයන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අනතුරු හා විපත් අවස්ථාවල දී අවස්ථෝචිත ව කටයුතු කිරීමේ අවශ්‍යතාව සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අනතුරු හා විපත් සිදු වූ අවස්ථාවල දී බුද්ධිමත් ව, අවස්ථාචිත ව කටයුතු කිරීමේ වැදගත්කම

  උදාහරණ:-
    - අවදානම් සහගත ලෙස අනතුර සිදු වූ ස්ථානයට ප්‍රවේශ නොවීම
    - සන්සුන් ව කටයුතු කිරීම
    - උදවු ලබා ගැනීම සඳහා අදාළ ආයතනවලට වහාම දැනුම් දීම
    - විපතට පත් වූවන්ගේ ජීවිත බේරා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
    - අනතුරට මුහුණ පා ඇති අයට නිසි ප්‍රථමාධාර ලබා දීම
    - අධිසංවේදී ව කටයුතු නොකිරීම
- අනාගතයේ දී මෙවැනි විපත්වලින් සිදු විය හැකි හානි අවම කර ගැනීම සඳහා පුරවැසියෙකු වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග
    - අනතුරු හා විපත් සිදු වන ආකාර පිළිබඳ ව දැනුම්වත් වීම
    - අදාළ ආයතන මඟින් දෙනු ලබන උපදෙස් පිළිපැදීම
    - අදාළ ආයතන විසින් දෙනු ලබන පුරෝකථන පිළිබඳ ව නිරන්තරයෙන් සැලකිලිමත් වීම
    - එදිනෙදා ජීවිතයේ සිදු විය හැකි ස්ථානීය අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කිරීම

      උදාහරණයක් :-නිවසේ විදුලි උපකරණ පරිහරණය කිරීමේ දී අපරීක්ෂාකාරී ව කටයුතු කිරීමෙන් වැළකීම<br>ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම
- අදාළ ආයතන දැනුම්වත් කිරීම
    - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
    - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
    - ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
    - රෝහල
    - පොලීසිය
    - ගිනි නිවන ඒකකය
    - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
    - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**ගුණාත්මක යෙදවුම්**

අනතුරු හා විපත් සිදු වූ අවස්ථාවල දී ක්‍රියාත්මක වන විවිධ ආයතන හා ඒවාට සම්බන්ධ නිලධාරීන්/ විපතට පත් අය මුදා ගැනීම/ සහන සැලසීම සඳහා ක්‍රියා කිරීමට සහභාගි වූ අවස්ථාවලට සම්බන්ධ ඡායාරූප/ පුවත්පත් වාර්තා

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව/ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය/ පොලීසිය ආදි ආයතන මඟින් අනතුරු පිළිබඳ නිකුත් කරන නිවේදන ඇතුළත් පුවත්පත් වාර්තා/ වීඩියෝ දර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ආපදා පිළිබඳ අනතුරු හැඟවීම දක්වෙන වාර්තා සැලකිල්ලට ගෙන අනතුරුවලින් හා විපත් වලින් සිදු වන හානි අවම කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ ව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සකස් කරන ලිපි/වාර්තා ආදිය පදනම් කරගෙන නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදුකරන්න.

**නිපුණතා මට්ටම**

8.4.3 ආපදා කළමනාකරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- අනතුරු හා විපත් සිදු විය හැකි අවස්ථා පිළිබඳ සැලකිලිමත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අනතුරුවලින් හා විපත්වලින් ආරක්ෂා වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි.
- ස්ථානීය අනතුරුවලින් හැරුණු විට වෙනත් අනතුරු සිදු විය හැකි අවස්ථාවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ආහාර හා ඖෂධ නිසා සිදු වන විපත්වලින් හා අනතුරුවලින් ආරක්ෂා වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අහිතකර ජීවන පුරුදු අනතුරු හා විපත් ඇති වීමට හේතු වන බව පැහැදිලි කරයි.
- අහිතකර ජීවන පුරුදුවලින් මිදීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අනතුරු හා විපත් සිදු විය හැකි ස්ථාන

  උදාහරණ:-
  - නිවස
  - අවට පරිසරය
  - පාසල
  - වැඩබිම
  - මහා මාර්ග
  - ගංගා/ ජලාශවල/ මුහුදේ දිය නෑම
- මෙම ස්ථානවල දී අනතුරු සිදු විය හැකි අවස්ථා හා අනතුරු සිදු විය හැකි ආකාර හඳුනා ගැනීම
- එම අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
- ස්ථානීය අනතුරු හැරුණු විට අනතුරු සිදු වන වෙනත් අවස්ථා

  උදාහරණ:-
  - වන සතුන්ගෙන්
  - සුනඛයන්ගෙන්
  - සර්පයන්ගෙන්
- ආහාර හා ඖෂධ සම්බන්ධයෙන් සිදු විය හැකි අනතුරු

  උදාහරණ:-
  - ආහාර විෂ වීම

    ආහාර නිසා සිදු වන අසාත්මිකතා

  එම තත්ත්ව ඇති වීමට බලපාන හේතු හා එම තත්ත්ව වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
- ඖෂධ සම්බන්ධ ව සිදු වන විපත් හා අනතුරු
  - අන්තරායකාරී ඖෂධ භාවිතය
  - ඖෂධ විෂ වීම
  - වෛද්‍ය උපදෙස් නොමැති ව ඖෂධ භාවිතය
  - නියමිත මාත්‍රාව නොපිළිපැදීම

- මෙම ඖෂධ සම්බන්ධයෙන් සිදු වන අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග
- අහිතකර පුරුදු නිසා ඇති වන අනතුරු හා විපත්

  උදාහරණ:- - මත්පැන් පානය කර රිය පැදවීම

  - චිත්තවේග යහපත් ලෙස පාලනයට අපොහොසත් වීම නිසා කලකෝලාහල ඇති වීම

**ගුණාත්මක යෙදවුම්**

නිවසේ දී /වැඩබිමේ දී/ පාසලේ දී/අවට පරිසරයේ දී සිදු වූ අනතුරු හා විපත් පිළිබඳ විස්තර දැක්වෙන පුවත්පත් වාර්තා/ ජායාරූප/ වීඩියෝ දර්ශන

වනසතුන්ගෙන් / සුනඛයන්ගෙන් / සර්පයන්ගෙන් සිදු වූ අනතුරු හා විපත් පිළිබඳ පුවත්පත් වාර්තා/ ජායාරූප

ආහාර /ඖෂධ සම්බන්ධයෙන් සිදු වූ විපත් අනතුරු පිළිබඳ විස්තර දැක්වෙන පුවත්පත් වාර්තා / ජායාරූප,

දුම්පානය/ මත්පැන් පානය ආදි අහිතකර පුරුදු නිසා සිදු වන විපත් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පාඩමට අදාළ විෂය කරුණු පැවරුම්/ ගවේෂණ, සිද්ධි අධ්‍යයනය ආදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද ඇසුරින් විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.4.4 මාර්ග නීතිරීති පිළිපදිමින් මාර්ග අනතුරු අවම කිරීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- වර්තමානයේ දී සිදු වන මාර්ග අනතුරු හා විපත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මාර්ග අනතුරුවලට හේතු පැහැදිලි කරයි.
- අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.
- මාර්ග නීතිරීති, සංඥා හා සලකුණු ඇසුරින් පැහැදිලි කරයි.
- දුම්රිය අනතුරුවලට හේතු පැහැදිලි කරයි.
- දුම්රිය අනතුරු වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පෙන්වාදෙයි.
- මාර්ග හා දුම්රිය අනතුරු සිදු වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- මාර්ග අනතුරු හැඳින්වීම
  - රිය අනතුරු නිසා සිදු වන හානි

    (කාලීන තොරතුරු ඇසුරින් රිය අනතුරු නිසා දෛනික ව සිදු වන ජීවිත හානි, ඒවායේ ප්‍රතිඵල ඉස්මතු කරමින් රිය අනතුරු පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳ ව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුම්වත් කරන්න)
- මාර්ග අනතුරුවලට හේතු
  - රියදුරන් අතින් සිදු වන වැරදි
  - පදිකයන් අතින් සිදු වන වැරදි
  - මාර්ගවල තත්ත්වය
  - වාහනවල ධාවන තත්ත්වය

  ඉහත හේතු නිදසුන් සහිත ව පැහැදිලි කිරීම
- මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග
  - මාර්ග නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
  - රියදුරන්/ මඟින් දැනුම්වත් කිරීම
  - මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම
  - රියදුරු පුහුණුව විධිමත් කිරීම
  - යෝග්‍යතාවෙන් තොර වාහන ධාවනයෙන් ඉවත් කිරීම
  - රිය අනතුරු වළක්වා ගැනීම සඳහා රියදුරන්ගේ විශේෂ අවධානය යොමු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මාර්ග අනතුරක් සිදු වූ අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය
  - රියැදුරන් ක්‍රියා කළ යුතු ආකාරය
  - ජනතාව ක්‍රියා කළ යුතු ආකාරය
  - පොලීසිය ක්‍රියා කළ යුතු ආකාරය
- දුම්රිය අනතුරු

  දුම්රිය අනතුරුවලට හේතු
  - දුම්රිය මාර්ගයේ පදිකයන් ගමන් කිරීම අනතුරුවලට හේතු වන බව
  - දුම්රිය මාර්ග හරහා නොසැලකිලිමත් ව/ මාර්ග සංඥා නොසලකා රථවාහන ධාවනය කිරීම

- දුම්රිය/ මාර්ග සංඥා ආදිය සම්බන්ධ ව සිදු වන කාර්මික දෝෂ

- දුම්රිය අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග
  - පා පුවරුවේ ගමන් නොකිරීම
  - දුම්රිය මාර්ගයේ පදිකයන් ගමන් නොකිරීම
  - ධාවනය වන දුම්රියට නැගීමෙන් හෝ බැසීමෙන් වැළකීම
- දුම්රිය අනතුරක් සිදු වූ අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය

  උදාහරණ:- තුවාලකරුවන් රෝහලට ගෙන යැම

**ගුණාත්මක යෙදවුම්**

මාර්ග අනතුරු, දුම්රිය අනතුරු හා ඒවායින් සිදු වන හානි දක්වෙන ඡායාරූප/ පුවත්පත් වාර්තා/ වීඩියෝ දර්ශන,

මාර්ග සංඥා, දක්වෙන රූප,

මාර්ග අනතුරු, දුම්රිය අනතුරු සිදු වූ අවස්ථාවල දී විවිධ ආයතන/ පුද්ගලයන් ක්‍රියාකාරී ව අනතුරට පත් අයට ආධාර සැපයීම සඳහා ක්‍රියා කළ අවස්ථා දක්වෙන ඡායාරූප/ පුවත්පත් වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථා ඇසුරින් අදාළ විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර සුදුසු ඇගයීම් නිර්ණායක භාවිත කර ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.4.5 රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් සිදු වන අනතුරු අවම කිරීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- රසායන ද්‍රව්‍ය භාවිතය මඟින් සිදු විය හැකි අනතුරු පැහැදිලි කරයි.
- රසායන ද්‍රව්‍ය සම්බන්ධ අනතුරක් සිදු වූ අවස්ථාවක දී ගත යුතු ක්‍රියාමාර්ග විස්තර කරයි.
- රසායන ද්‍රව්‍ය ආශ්‍රිත අනතුරු වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- රසායන ද්‍රව්‍ය භාවිතය නිසා සිදු වන අනතුරු

- රසායන ද්‍රව්‍ය භාවිත කරන අවස්ථා
    - කෘමි මර්දනය සඳහා
    - කෘෂිකාර්මික කටයුතු සඳහා
    - කර්මාන්තශාලාවල අමුද්‍රව්‍ය ලෙස
    - සනීපාරක්ෂක කටයුතු සඳහා
    - ගෙවතු වගා කටයුතු සඳහා
    - පාසල් විද්‍යාගාරවල පර්යේෂණ කටයුතු සඳහා

- රසායන ද්‍රව්‍යවලින් අනතුරු සිදු විය හැකි ආකාර
    - අනාරක්ෂිත ලෙස ගබඩා කිරීම
    - ආහාර ද්‍රව්‍ය සමඟ එක ම ස්ථානයක ගබඩා කිරීම
    - ලේබල් නිසි පරිදි ප්‍රදර්ශනය වන ලෙස ගබඩා නොකිරීම
    - කුඩා ළමයින්ට පහසුවෙන් හසු වන ස්ථානවල තැබීම
    - භාවිතය සම්බන්ධයෙන් සපයන උපදෙස් නොපිළිපැදීම
    - නිර්දේශිත පරිදි සාන්ද්‍රණය නොකිරීම
    - හිස් බෝතල්/ ඉතිරි ද්‍රව්‍ය ජලයට බැහැර කිරීම

- රසායන ද්‍රව්‍ය සම්බන්ධ අනතුරක් සිදු වූ අවස්ථාවක අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග
    - අනතුරට හේතුව නිසි පරිදි හඳුනා ගැනීම
    - සුදුසු පරිදි ප්‍රථමාධාර ලබා දීම
    - හැකි ඉක්මනින් වෛද්‍යවරයකු වෙත යොමු කිරීම
    - ශරීරගත වූ රසායන ද්‍රව්‍ය අඩංගු බෝතලය/ දවටන ආදිය (හැකි සෑම විට ම) වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම

- රසායන ද්‍රව්‍ය සම්බන්ධ අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග
    - ආරක්ෂිත ලෙස ගබඩා කිරීම
      උදාහරණ:- කුඩා ළමයින්ට හසු නොවන සේ
    - භාවිත කරන විට අවශ්‍ය ආරක්ෂිත ආවරණ භාවිතය

උදාහරණ:-     අත් වැසුම්/ මුඛවාඩම්/ පාවහන්

- භාවිත කිරීමට පෙර උපදෙස් කියවා අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

කෘෂිකාර්මික, සනීපාරක්ෂක කටයුතු ආදිය සඳහා භාවිත කරන ද්‍රව්‍යවල ඇසුරුම් ලේබලවල සඳහන් උපදෙස් (උදාහරණ:- සාන්ද්‍රණය කිරීම, ගබඩා කිරීම, භාවිත කළ යුතු ආකාරය, ආරක්ෂාව සඳහා උපදෙස්),

රසායනික ද්‍රව්‍යවලින් සිදු වූ අනතුරු හා විපත් සම්බන්ධ තොරතුරු වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය වූවා දැයි මැන බැලීම සඳහා සුදුසු නිර්ණායක භාවිත කර ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.4.6 දැරිය හැකි ජීවන රටාවකට අනුගත වෙමින් තිරසර සංවර්ධනයට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- දැරිය හැකි ජීවන රටාව පිළිබඳ ව සාකච්ඡා කරයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීමෙන් තිරසර සංවර්ධනයට දායක විය හැකි බවට අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- දැරිය හැකි ජීවන රටාව යන්න හැඳින්වීම
- දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීම
  - වර්තමානයේ මිනිසාගේ වුවමනා හා අවශ්‍යතා සංකීර්ණ වීම
  - එම අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති සම්පත් සීමිත ය
  - එම සම්පත් අනාගත පරපුරට ද ඉතිරි කර තැබීම වත්මන් පරපුරේ යුතුකම වේ.

ඉහත කරුණු ද සැලකිල්ලට ගෙන තම ආර්ථික මට්ටමට ගැළපෙන ලෙස වුවමනා සහ අවශ්‍යතා ඉටු කර ගැනීමට පෙලඹීම, දැරිය හැකි පරිභෝජන රටාවකට හුරු වීම ලෙස කෙටියෙන් විස්තර කළ හැකි ය.

අවශ්‍යතා:-

- ආහාර, ඇඳුම් හා නිවාස
- ජලය සහ විදුලිය
- බලශක්තිය
- ප්‍රවාහණ අවශ්‍යතා
- විවේකය විනෝදයෙන් ගත කිරීම
- සෞඛ්‍ය හා සනීපාරක්ෂාව

" අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටු කර ගැනීම තිරසර සංවර්ධනය යි "

- රටක පුරවැසියන් දැරිය හැකි ජීවන රටාවකට හුරු වීම තමන්ටත්, සමාජයටත්, රටටත් වැඩදායක වන අතර, එමඟින් තිරසර සංවර්ධනයට දායක වෙමින් පුරවැසි යුතුකම් ඉටු කිරීමට ද හැකියාව ලැබේ.

**ගුණාත්මක යෙදවුම්**

බයිසිකලයක, රෝද දෙකේ ට්රැක්ටරයක/ දර භාවිත කරන පිරිමැසුම්දායක උදුනක ඡායාරූප සහ ඒවා භාවිත කිරීමෙන් අත්වන ප්‍රතිලාභ දක්වෙන සටහනක්, අඩු වියදමකින් පෝෂ්‍යදායී ආහාර වේලක් සකස් කර ගැනීමට යොදාගත හැකි ද්‍රව්‍ය දක්වෙන ලේඛනයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය වූවා දැයි මැන බැලීම සඳහා සුදුසු නිර්ණායක භාවිත කර ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම් 8.4

**නිපුණතාව** 8.4 • ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 8.4.3 • ආපදා කළමනාකරණය කරයි.

**ඉගෙනුම් පල**

- අනතුරු හා විපත් සිදු විය හැකි අවස්ථා පිළිබඳ සැලකිලිමත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අනතුරුවලින් හා විපත්වලින් ආරක්ෂා වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි.
- ස්ථානීය අනතුරු හැරුණු විට වෙනත් අනතුරු සිදු විය හැකි අවස්ථාවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ආහාර හා ඖෂධ නිසා සිදු වන විපත්වලින් හා අනතුරුවලින් ආරක්ෂා වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අහිතකර ජීවන පුරුදු, අනතුරු හා විපත් ඇති වීමට හේතු වන බව නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- අහිතකර ජීවන පුරුදුවලින් මිදීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම** - "පළමු ව ආරක්ෂාව"

**කාලය** - මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** -

- නිවසේ දී/ පාසලේ දී හෝ වැඩපලේ දී හෝ සිදු වූ අනතුරු දෙකක් පිළිබඳ පුවත්පත් වාර්තා හා ඡායාරූප සපයා ගන්න.
- ෆෙල්ට් පෑන්, බ්‍රිස්ල් බෝඩ්/ ඩිමයි කඩදාසි
- ඇමුණුම 01හි දැක්වෙන කාර්ය පත්‍රිකා

**ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I** - ගුණාත්මක යෙදවුම් යටතේ දක්වා ඇති පුවත්පත් වාර්තා පන්තියට ඉදිරිපත් කරන්න. නිවසේ දී, පාසලේ දී, අවට පරිසරයේ දී සිදු වන අනතුරු හා වන සතුන්, සුනඛයන්, සර්පයන්ගෙන් සිදු වන විපත් පිළිබඳ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න. තව ද ආහාර, ඖෂධ සම්බන්ධ අනතුරු, අහිතකර පුරුදු නිසා සිදු වන විපත් පිළිබඳ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සමඟ කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 05)

**පියවර II** -

- පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. ඇමුණුම 01 හි දැක්වෙන කාර්ය පත්‍රිකා කණ්ඩායම් වෙත සපයන්න.
- කණ්ඩායම් වෙත ගොස් කාර්ය නිම කිරීම සඳහා සහාය ලබා දෙන්න.
- කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ලබා දෙන්න.

(මිනිත්තු 20)

පියවර III - • ඉගෙනුම් පල සාධනය වන පරිදි ශිෂ්‍ය-ශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක මත තක්සේරුව හා ඇගයීම සිදු කරන්න. (මිනිත්තු 15)

**ඇගයීම් නිර්ණායක**

- අනතුරු හා විපත් සිදු විය හැකි ආකාර නම් කරයි.
- අනතුරු හා විපත් අවම කර ගැනීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.
- අනතුරුවලින් හා විපත්වලින් වැළකීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ලියයි.
- අනතුරුවලින් හා විපත්වලින් වැළකිය හැකි ආකාර පිළිබඳ අන් අය දැනුම්වත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කරයි.

ඇමුණුම 1

**කාර්ය පත්‍රිකාව**

**කණ්ඩායම් අංක 01**

- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න. ( සපයා ඇති ඩිමයි, බ්‍රිස්ල් බෝඩ් මේ සඳහා යොදා ගන්න)
- එය පන්තියට ඉදිරිපත් කරන්න.

| නිවසේ දී සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| •<br>•<br>•<br>• | | |
| පාසලේ දී සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
| •<br>•<br>•<br>• | | |

**කාර්ය පත්‍රිකාව**
**කණ්ඩායම් අංක 02**

- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න. ( සපයා ඇති ඩිමයි, බ්‍රිස්ල් බෝඩ් මේ සඳහා යොදා ගන්න)
- එය පන්තියට ඉදිරිපත් කරන්න.

| වැඩබිමේ දී සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| •<br>•<br>•<br>• | | |
| වන සතුන්ගෙන් සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
| •<br>•<br>•<br>• | | |

**කාර්ය පත්‍රිකාව**
**කණ්ඩායම් අංක 03**

- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න. ( සපයා ඇති ඩිමයි, බ්‍රිස්ල් බෝඩ් මේ සඳහා යොදා ගන්න)
- එය පන්තියට ඉදිරිපත් කරන්න.

| සුනඛයින්/සර්පයන්ගෙන් සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| •<br>•<br>•<br>• | | |
| අවට පරිසරයේ දී සිදු විය හැකි අනතුරු | අනතුරට බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
| | | |

**කාර්ය පත්‍රිකාව**
**කණ්ඩායම් අංක 04**

- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න. ( සපයා ඇති ඩිමයි, බ්‍රිස්ල් බෝඩ් මේ සඳහා යොදා ගන්න)
- එය පන්තියට ඉදිරිපත් කරන්න.

| ආහාරවලින් හා ඖෂධවලින් සිදු විය හැකි අනතුරු | අනතුරට ලක් වීම කෙරෙහි බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| •<br>•<br>• | | |
| අහිතකර ජීවන පුරුදු නිසා සිදු විය හැකි අනතුරු | අනතුරට ලක්වීම කෙරෙහි බලපාන හේතු | අනතුර වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
| | | |

## 8.5 ගැටලු විසඳීම හා තීරණ ගැනීම

පුද්ගල ජීවිතයේ දී මෙන් ම සමාජ ජීවිතයේ දී ද පුද්ගලයාට විවිධ අභියෝගවලට හා ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. මේ සඳහා සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් පුද්ගලයන් තුළ වර්ධනය කිරීම වැදගත් වේ. වර්තමාන ජන සමාජයේ ඇතැම් දරුවන් ගැටලුවලට හා අභියෝගවලට මුහුණ දී මේ දී ගනු ලබන තීරණ නිවැරදි නොවීම නිසා ජීවිත අසාර්ථක තත්ත්වයට පත් කර ගන්නා අතර ඇතැම් විට ජීවිත හානි ද සිදු කර ගනු ලැබේ. එබැවින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ ගැටලුවක් නිවැරදි ව හඳුනාගෙන විශ්ලේෂණය කර නිර්මාණශීලී ව විකල්ප ජනනය මඟින් නිවැරදි තීරණ ගැනීමට හා අභියෝග ජය ගැනීමට අවශ්‍ය ශක්තීන් සංවර්ධනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරිමේ දී ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ඉඩ ප්‍රස්තා ව සැපයීම අත්‍යවශ්‍ය වේ.

**නිපුණතාව 8.5**

- ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායි ව තීරණ ගනියි.

**නිපුණතා මට්ටම**

8.5.1 එදිනෙදා ජීවිතයේ දී මුහුණ පෑමට සිදු වන විවිධ ගැටලු හා අභියෝග පිළිබඳ ව විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි**

**ඉගෙනුම් පල**

- ගැටලු හා අභියෝග සරල ව අර්ථ දක්වයි.
- එදිනෙදා ජීවිතයේ දී මුහුණ පාන ගැටලු හා අභියෝග පිළිබඳ විමසිලිමත් ව කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- එදිනෙදා ජීවිතයේ දී මතු වන ගැටලුවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගත යුතු බවට අදහස් දක්වයි.


**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

ගැටලු හා අභියෝග හඳුනා ගැනීම

- පුද්ගල ජීවිතයේ මෙන් ම සමාජ ජීවිතයේත් කටයුතු කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වීම
- ගැටලුවක් යනු පවත්නා තත්ත්වය හා අපේක්ෂිත තත්ත්වය අතර පවතින වෙනස යි. උදාහරණ:-

| පවත්නා තත්ත්වය | අපේක්ෂිත තත්ත්වය |
|---|---|
| අධ්‍යාපන කටයුතු සාර්ථක ව ඉටු කරගෙන යාම සඳහා ආර්ථික දුෂ්කරතා පැවතීම | අධ්‍යාපන කටයුතු සාර්ථක ඉලක්ක කරා යොමු කර ගැනීම |




- පවත්නා තත්ත්වයෙන් අත්මිදීම සඳහා විසඳුම් සෙවීම අවශ්‍ය වීම
- ගැටලු සඳහා විසඳුම් සෙවීමට ප්‍රථම හේතු සෙවීම
- ගැටලුව විශ්ලේෂණය මඟින් හේතු අනාවරණය කරගත හැකි වීම

- හේතු අනාවරණය මගින් විසඳුම් සොයාගත හැකි වීම
- අභියෝගයක් යනු ජීවිත ඉලක්ක ජය ගැනීම සඳහා ක්‍රියාත්මක වීමේ දී මුහුණ පෑමට සිදු වන බාධක ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය
- එළඹෙන තත්ත්වවලට සාර්ථක ව මුහුණ දීම මගින් අභියෝග ජයග්‍රහණය කළ හැකි වීම
- එදිනෙදා ජීවිතයේ දී විවිධ ගැටලුවලට හා අභියෝගවලට මුහුණ දීමට සිදු වීම
- පවුලේ කටයුතුවල දී මෙන් ම පාසලේ කටයුතුවල දී ද සමාජීය කටයුතුවල දී ද මෙවැනි ගැටලුවලට හා අභියෝගවලට මුහුණ දීමට සිදු වීම
- එවැනි ගැටලුවල දී හා අභියෝගාත්මක අවස්ථාවල දී ඊට යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා තම ශක්තීන් වර්ධනය කර ගැනීමට යොමු වීම
- ගැටලු හා අභියෝග ජය ගැනීමට උචිත ලෙස තම පෞරුෂය සංවර්ධනය කරගැනීම හා මානසික ශක්තිය වර්ධනය කර ගැනීම වැදගත් වීම

**ගුණාත්මක යෙදවුම්**

එදිනෙදා ජීවිතයේ දී මුහුණ දෙන අභියෝග හා ගැටලු පිළිබඳ සිද්ධි කිහිපයක් ඇතුළත් පුවත්පත් වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- කණ්ඩායම් ක්‍රියාකාරකම්, තොරතුරු පත්‍රිකා ගවේෂණය, භූමිකා රංගන වැනි ඉගෙනුම් ක්‍රමවේද සම්පාදනය මගින් විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කරවන්න. අදාළ ඉගෙනුම් පල සාධනය වීම මැන බැලීම සඳහා නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.5.2 ජීවිතයේ විවිධ ගැටලුවලට හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි**

**ඉගෙනුම් පල**

- ගැටලුවලට මුහුණ දීමට සිදු වීම සාමාන්‍ය දිවි පැවැත්මට අදාළ සිද්ධියක් බව පැහැදිලි කරයි.
- ඕනෑ ම අභියෝගයකට හා ගැටලුවකට විසඳුම් පවතින බව විස්තර කරයි.
- ජීවිතය ජය ගැනීම සඳහා අභියෝගවලට හා ගැටලුවලට නිර්මාණශීලි විසඳුම් සෙවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- විවිධ ගැටලු හා අභියෝග ජය ගැනීම සඳහා නිර්මාණශීලී ක්‍රම අනුගමනය කිරීම
- ගැටලු හා අභියෝග අවස්ථානුකූල ව මෙන් ම පුද්ගලයාගෙන් පුද්ගලයාට ද වෙනස් වීම
- ජීවත් වීම යනු ගැටලුවලට හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දීම යි
- ගැටලු හා අභියෝග අලුත් දෙයක් නොවන බව හා සාමාන්‍ය දිවි පැවැත්මේ සංසිද්ධියක් වේ
- ගැටලු සඳහා විසඳුම් පවතින අතර අභියෝග සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පැවතීම
- ගැටලුවලින් පලා නොයාම ද ජීවිත පුරුද්දක් කර ගැනීමේ වැදගත්කම
- අභියෝගවලට සාර්ථක ව මුහුණ දීම ජීවිත අංගයක් බවට පත් කර ගැනීමේ වැදගත්කම
- ගැටලුවලට හා අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා නිර්මාණශීලී ක්‍රම අනුගමනය කළ හැකි වීම
- ගැටලු හා අභියෝග ජීවිත සාර්ථකත්වයට අදාළ කරගත හැකි ආකාරය
  - චිත්ත ධෛර්ය වර්ධනය කර ගැනීමට යොදා ගැනීම
  - ගැටලු ජීවිත අත්දැකීම් බවට පත් කර ගැනීම
  - ගැටලු නව නිර්මාණ බිහි කිරීමට යොදා ගැනීම
  - නව ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් ලබා ගැනීම
  - වැරදි නිවැරදි කර ගැනීමට යොමු වීම
  - විකල්ප විසඳුම් සඳහා උපදේශන සේවා ලබා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ අභියෝග ජය ගෙන ජීවිතය ජය ගත් පුද්ගලයන් කිහිප දෙනෙකු පිළිබඳ කෙටි පුවත්පත් වාර්තා කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- කණ්ඩායම් පැවරුම්, තොරතුරු ගවේෂණය වැනි ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද යටතේ විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවස්ථාව සලසා දෙන්න. අදාළ ඉගෙනුම් පල සාධනය වීම මැන බැලීම සඳහා නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම් 8.5

**නිපුණතාව** 8.5 • ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි.

**නිපුණතා මට්ටම** 8.5.2 • ජීවිතයේ විවිධ ගැටලු හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.

**ඉගෙනුම් පල** ඕනෑ ම අභියෝගයකට හා ගැටලුවකට විසඳුම් පවතින බව විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - "ගැටලුවක් ඇත් නම් විසඳුමක් ද ඇත"

**කාලය** - මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** -
- ඇමුණුම 8.5.2.1
- ඇමුණුම 8.5.2.2

**ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I** - ශිෂ්‍යයකු ලවා 8.5.2.1 ඇමුණුම පන්තිය ඉදිරියේ කියවීමට සැලැස්වීම හා ඒ මඟින් හෙළි වන තොරතුරු අනුව ඕනෑ ම කෙනෙකුට ජීවිතයේ විවිධ අභියෝග හා ගැටලුවලට මුහුණ දීමට සිදු වන බවත් ඒවා ජය ගැනීමට විසඳුම් සොයා ගැනීම මඟින් ජීවිතය ජය ගත හැකි බවත් පැහැදිලි කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
(මිනිත්තු 08)

**පියවර II** -
- පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සැම කණ්ඩායමකට ම ඇමුණුම 8.5.2.1 සහ ඇමුණුම 8.5.2.2 ට අදාළ කාර්ය පත්‍රිකා එක බැගින් ලබා දෙන්න.
- අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් නිම කිරීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න.
- තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 20)

**පියවර III** -
- එක් එක් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඇසුරු කර ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.
- පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න. (මිනිත්තු 12)

**ඇගයීම් නිර්ණායක**
- ඕනැම කෙනෙකුට ජීවිතයේ දී විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වන බව පැහැදිලි කරයි.
- පාසල් ශිෂ්‍යයකු ලෙස මුහුණ දුන් ගැටලුකාරී අවස්ථා සාකච්ඡා කරයි.
- විවිධ අභියෝගවලට හා ගැටලුවලට විසඳුම් යෝජනා කරයි.
- අභියෝග හා ගැටලු කෙනෙකුගේ ජීවිතය ජය ගැනීමට හේතු වන ආකාරය පිළිබඳ ව අන් අය දැනුම්වත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් සාමූහික ව කටයුතු කරයි.

ඇමුණුම 8.5.2.1

ශ්‍යාමලී නඳුන් උයන විදුහලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාවක් වුවා ය. ඇය ක්‍රියාකාරී, වගකීම් ඉටු කරන ශිෂ්‍ය නායිකාවක ලෙස විදුහල්පතිතුමාගේ සහ ගුරු මණ්ඩලයේ ප්‍රසාදය දිනා සිටියා ය. දිනක් විදුහල්පතිතුමා ශිෂ්‍ය නායක රැස්වීමේ දී ගත් තීරණයක් අනුව පාසලට ගැටලුවක් ව පවතින ප්‍රමාද වී පාසලට පැමිණෙන ශිෂ්‍යයන් පිළිබඳ ප්‍රශ්නය ගැන සොයා බැලීමට ශ්‍යාමලීට පැවරුවේ ය.
ඒ අනුව ශ්‍යාමලී පාසල ආරම්භ වීමට පෙර ගේට්ටුව ළඟ රැඳී සිටිමින් ප්‍රමාද වී පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිළිබඳ නිරීක්ෂණයක යෙදුණා ය. සති දෙකක් පමණ කරන ලද නිරීක්ෂණවල දී සැම දිනක ම ප්‍රමාද වී පැමිණෙන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් අට දෙනෙකු පමණ හඳුනා ගැනීමට ඇයට හැකි විය. ඇය පාසල් විනයභාර ගුරුතුමාගේ ද උපදෙස් මත එම ශිෂ්‍ය-ශිෂ්‍යාවන් පිළිබඳ ව සුවිශේෂී ව සොයා බැලීමට තීරණය කළා ය. ඒ අනුව දින කීපයක දී ම ශ්‍යාමලී එම ශිෂ්‍ය-ශිෂ්‍යාවන් හමු වී කථා කළා ය. ඔවුන්ගේ පැමිණීමේ ප්‍රමාදය හා එමඟින් ඔවුන් ට වන පාඩුව පෙන්වා දුන්නාය. ඉන් පසු පැමිණීම ප්‍රමාද වීමට හේතු වන කරුණු ලියාගෙන එන ලෙස ඇය ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුම්වත් කළා ය. ඔවුන් ඉදිරිපත් කළ හේතු තම ශිෂ්‍ය නායක සටහන් පොතේ මෙලෙස ඇතුළත් කර තිබිණි.

.

'' - අපේ පාරේ එක බස් එකයි තියෙන්නේ. ඒක තියෙන්නෙ පැයකට සැරයක්. උදේ 6.15ට හා ඉන් පසු 7.15ට උදේ බස් එකට එන්න අපිට බැරි වෙනවා
- උදේට නැගිටින්න පරක්කු වෙනවා
- පොත් ටික හදා ගන්න, ඇඳුම් මැද ගන්න හුඟක් වෙලා යනවා.
- උදේ කෑම ලැබෙන කොට පරක්කු වෙනවා''

ඒ නංගිලා මල්ලිලාට එම අපහසුතා මඟහැර ගැනීම සඳහා කළ හැකි යෝජනා තම අභ්‍යාස පොතේ ලියාගෙන ඒමට ශ්‍යාමලී උපදෙස් දුන්නා ය. ඔවුහු එම යෝජනා එදින ම ශ්‍යාමලීට ලබා දුන්හ. ශ්‍යාමලී එම යෝජනා පසු දින සිට ක්‍රියාවට යොදන බවට ඒ දරුවන් පොරොන්දු කර ගත්තා ය. ශ්‍යාමලී දින කිහිපයකට පසු ව පැමිණීම නැවත නිරීක්ෂණය කළා ය. දැන් ඒ දරුවන් කිසි ම දිනක ප්‍රමාද වී නොපැමිණෙන බව ශ්‍යාමලීට පෙනී ගියා ය. ශ්‍යාමලී ඒ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ප්‍රසංශා කළා ය. විදුහල්පතිතුමා ශිෂ්‍යනායකයන් හමුවේ ශ්‍යාමලීට ද ප්‍රසංශා කර ස්තුති කළේ ය.

- සියලු ම කණ්ඩායම් සඳහා මෙම ක්‍රියාකාරකම ලබා දෙන්න.

ඇමුණුම 8.5.2.2

**කාර්ය පත්‍රිකාව**

ප්‍රමාද වී පැමිණීම වළක්වා ගැනීම සඳහා එම ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ඉදිරිපත් කිරීමට ඇතැයි ඔබ සිතන යෝජනා සටහන් කරන්න. ඒවා පන්තියට ඉදිරිපත් කරන්න.

1.
2.
3.
4.
5.

## 8.6 වැඩ ලෝකය

ජන සමාජයේ ඇති විවිධ ක්ෂේත්‍රවලට අදාළ ජීවන වෘත්ති, රැකියා සියල්ල වැඩ ලෝකය ලෙස හැඳින්වේ. වර්තමාන සමාජය තුළ පෙරට වඩා අතිශය සංකීර්ණ වූ වැඩ ලෝකයක් බිහි වී ඇත. අනාගත වෘත්තීන් තෝරා ගැනීමේ දී තම හැකියා දක්ෂතා හා අපේක්ෂා අනුව අනාගත වෘත්තීය ලෝකය ගොඩනගා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබා ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ලබා දීම වැදගත් වේ. ඒ අනුව ශ්‍රම අභිමානයක් ඇති කර ගැනීම, පුහුණු ශ්‍රමයේ වැදගත්කම, පුහුණු ශ්‍රමය ලබා ගැනීමට යොමු විය හැකි පාඨමාලා හා ආයතන, රැකියා වෙළෙඳ පොළෙහි ප්‍රමුඛතා ආදි ක්ෂේත්‍ර පිළිබඳ ව දැනුම්වත් භාවයක් ඇති කර ගැනීම වැදගත් වේ.

එමෙන් ම යහපත් ශ්‍රමිකයකු සතු ගුණාංග වර්ධනය කර ගැනීම, යුතුකම් හා වගකීම් ඉටු කිරීම, සේවා ස්ථානයේ අපේක්ෂා ඉටු කිරීමට දායක විය හැකි ආකාරය, සේවක අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධය ද මෙහි දී අවධානයට ලක් කර ඇත. එලෙස ම වෘත්තිය ගුණාංග ප්‍රගුණ කර ගත හැකි ක්‍රම, තමා වෙත පැමිණෙන සේවාලාභීන් තෘප්තිමත් කළ හැකි ආකාරය මෙන් ම තම වෘත්තිය මගින් යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට අවැසි ශක්තීන් වර්ධනය කර ගැනීම කෙරෙහි මෙම ඒකකයේ දී අවධානය යොමු කර ඇත. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උක්ත ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රායෝගික හා න්‍යායාත්මක ව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුම්වත් කරමින් නිවැරදි ව වෘත්තිය මාර්ගෝපදේශනය ලබා දීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

**නිපුණතාව 8.6**

- වැඩ ලෝකයට හුරු වෙයි.

**නිපුණතා මට්ටම**

8.6.1 • වැඩ ලෝකයේ විවිධත්වය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- වැඩ ලෝකයේ විවිධත්වය පැහැදිලි කරයි.
- වැඩ ලෝකයේ විවිධත්වයෙහිලාවිවිධ රැකියා අවස්ථා පවතින බව විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- වැඩ ලෝකය හැඳින්වීම
  - සමාජයේ ඇති විවිධ රැකියා ක්ෂේත්‍රවලට අදාළ රැකියා හා වෘත්ති සියල්ල වැඩ ලෝකය ලෙස සරල ව හඳුන්වන්න.
  - ඒ අනුව වැඩ ලෝකය විවිධ රැකියාවල නිරත ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවකින් සමන්විත වන බව
  - තවත් විශාල පිරිසකට වැඩ ලෝකයේ රැකියා අවස්ථා සැපයිය හැකි බව
- වැඩ ලෝකයේ පවතින රැකියා ක්ෂේත්‍ර
  - කෘෂිකාර්මික
  - කාර්මික
  - සේවා
- මෙම ක්ෂේත්‍රවලට අදාළ රැකියා හඳුනා ගැනීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න
- මෙම ක්ෂේත්‍රවල රැකියා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය මෙන් ම ස්වයං රැකියා ලෙස ද පවතින බව
- එක් එක් ක්ෂේත්‍රයට අදාළ රැකියා අවස්ථාවන්ට නිදසුන්
- වැඩ ලෝකයේ විවිධත්වයට බලපාන සාධක

  නිදසුන්:-
  - ප්‍රදේශයක පවතින ස්වාභාවික සම්පත් හා භෞතික සම්පත්
  - මානව සම්පත
  - සමාජ අවශ්‍යතා
- වැඩ ලෝකයේ රැකියා ක්ෂේත්‍රවල නව ප්‍රවණතා

  උදාහරණ:-
  - තොරතුරු තාක්ෂණය ආශ්‍රිත නව රැකියා
  - පුහුණු ශ්‍රමිකයන් සඳහා විදේශ රැකියා වෙළෙඳපොළ විවෘත වීම
  - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා

**ගුණාත්මක යෙදවුම්**

වැඩ ලෝකයේ විවිධත්වය දැක්වෙන රැකියා නාම ලේඛන, පුවත්පත් දැන්වීම්, අන්තර්ජාලය ඇසුරින් වැඩ ලෝකයේ නව ප්‍රවණතා දැක්වෙන විස්තර/ ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- වැඩ ලෝකයේ විවිධත්වය පිළිබඳව තොරතුරු ඇසුරින් කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් සිදු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.2 ශ්‍රම අභිමානයෙන් යුක්ත ව කටයුතු කිරීමේ වැදගත්කම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රම අභිමානයෙන් යුතු ව සේවයේ යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ශ්‍රම අභිමානයෙන් යුතු ව කටයුතු කිරීම රැකියා තෘප්තියට හේතු වන බවට කරුණු ඉදිරිපත් කරයි.
- ශ්‍රම අභිමානයෙන් කටයුතු කිරීම නිසා අත් වන ප්‍රයෝජන පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ශ්‍රම අභිමානය හැඳින්වීම
- සෑම ශ්‍රමිකයකුගේ ම ශ්‍රමය ගරු කටයුතු බව සැලැකීමත් ඒ මඟින් තම සේවය පිළිබඳ ව අභිමානයක් ඇතිකර ගැනීමත් ශ්‍රම අභිමානය යි.
- සෑම ශ්‍රමිකයකු ම ශ්‍රම අභිමානයෙන් යුතු ව කටයුතු කිරිම නිසා අත්වන ප්‍රයෝජන
  - තම සේවය/ ශ්‍රමය සමාජයේ ඇගයීමට ලක් වීම
  - සේවායෝජකයාට අත්වන ප්‍රයෝජන
  - සේවාදායකයන්ට අත්වන ප්‍රයෝජන
  - සේවාලාභීන්ට අත්වන ප්‍රයෝජන හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

රාජ්‍ය/ පෞද්ගලික/ ස්වයං රැකියා යන අංශවල රැකියාවල නිරත පුද්ගලයන්ගේ සේවය ඇගයීමට ලක් වූ අවස්ථා කිහිපයක් පිළිබඳ ව පුවත්පත් වාර්තා/ වීඩියෝ දර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ඇසුරින් අදාළ විෂය කරුණු අධ්‍යයනයට යොමු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.3 සෑම රැකියාවක් ම සමාජයේ ප්‍රගමනයට හේතු වන ආකාරය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- සෑම රැකියාවක් ම සමාජ අවශ්‍යතා ඉටු කිරීමට දායක වන අයුරු පැහැදිලි කරයි.
- සෑම රැකියාවක් ම සමාජ අභිවෘද්ධියට හේතු වන බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සෑම නීත්‍යනුකූල රැකියාවක් ම සමාජ අවශ්‍යතාවක් ඉටු කිරීමට දායක වන බව

| | | | |
|---|---|---|---|
| උදාහරණ:- | ගොවියා | - | ආහාර නිෂ්පාදනය |
| | වෛද්‍යවරයා | - | රෝගීන් සුවපත් කිරීම |
| | ගුරුවරයා | - | අධ්‍යාපනය ලබා දීම මගින් යහපත් පුරවැසියන් රටට දායක කිරීම |
| | පෙදරේරු ශිල්පීහු | - | නිවාස හා වෙනත් ඉදි කිරීම් |
| | රූපලාවණ්‍ය ශිල්පීහු | - | රූපලාවණ්‍ය කටයුතු |

- පුද්ගල හැකියා අනුව රැකියාවල නිරත වීම මඟින් සමාජ ප්‍රගමනයට දායක වන ආකාරය
- විවිධ රැකියා, සමාජ අවශ්‍යතා ඉටු කිරීමට දායක වීම මඟින් සමාජ අභිවෘද්ධියට හා සමාජ ප්‍රගමනයට හේතු වන බව
- ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට විවිධ රැකියාවලින් ඉටු වන සේවය

**ගුණාත්මක යෙදවුම්**

සමාජ අවශ්‍යතා ඉටු කිරීමට විවිධ වෘත්ති දායක වන අයුරු දැක්වෙන චිත්‍ර/ ඡායාරූප/ විස්තර වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සෑම වෘත්තියක් ම සමාජ සංවර්ධනයට දායක වේ යන ආකල්පය වර්ධනය වන අයුරින් විෂය කරුණු අධ්‍යයනය කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන් යොමු කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.4 පුහුණු ශ්‍රමයේ වැදගත්කම විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රමිකයකු වශයෙන් තම රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වීම් ලබා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ශ්‍රමිකයකුට වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා ඇති අවස්ථා ප්‍රකාශ කරයි.
- ශ්‍රමයේ ඵලදායීතාව පුහුණුව මත රඳා පවතින බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- වෘත්තීය කටයුතු සඳහා සාපේක්ෂ වශයෙන් ශ්‍රමය වැය කරන ස්වරූපය අනුව, කායික ශ්‍රමය හා මානසික ශ්‍රමය වශයෙන් ශ්‍රමය වර්ග කර දැක්විය හැකි බව හඳුනා ගැනීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- වැඩි වශයෙන් කායික ශ්‍රමය වැය කරන රැකියා - ගොවියෝ, කම්කරුවෝ
පෙදරේරු ශිල්පීහු
වඩු කාර්මික ශිල්පීහු

වැඩි වශයෙන් මානසික ශ්‍රමය වැය කරන රැකියා - වෛද්‍යවරයා
ගුරුවරයා
කළමනාකරුවෝ

පුහුණු ශ්‍රමය:-
- ඵලදායි ශ්‍රමිකයකු වීමට තම රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වීම් අවශ්‍ය බව
- පුහුණු ශ්‍රමය ගුණාත්මක භාවය කෙරෙහි බලපාන ආකාරය
- පුහුණු ශ්‍රමයට දේශීය මෙන්ම විදේශ රැකියා වෙළෙඳපොළේ විශාල ඉල්ලුමක් පැවතීම
- පුහුණුව ලබා දෙන රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා පාඨමාලා හඳුන්වා දීම

උදාහරණ:- රාජ්‍ය අංශය - වෘත්තීය පුහුණු අධිකාරිය
තරුණ සේවා සභාව

පෞද්ගලික අංශය - පෞද්ගලික හෙද විද්‍යාල
පෞද්ගලික රියදුරු පාසල්

- මෙම ආයතනවලින් සිදු වන සේවය පිළිබඳ ව දැනුම්වත් වීම , ඒවායින් සේවය ලබා ගැනීමට යොමු වීමේ වැදගත්කම

**ගුණාත්මක යෙදවුම්**

වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වෙන ආයතන හා පාඨමාලා විස්තර දැක්වෙන පුවත්පත් වාර්තා/ දැන්වීම්/ අන්තර්ජාලය ඇසුරින්

ඵලදායී ශ්‍රමිකයකු ඇගයීමට ලක් වූ අවස්ථා පිළිබඳ වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- තොරතුරු ගවේෂණය, කණ්ඩායම් ක්‍රියාකාරකම් වැනි ඵලදායි ඉගෙනුම් ක්‍රමවේද මඟින් විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කර, ඉගෙනුම් පල සාධනය වීම පිළිබඳ නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.5 යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග අභ්‍යන්තරීකරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග පැහැදිලි කරයි.
- සේවා ස්ථානයෙහි දී යහපත් ගුණාංග පවත්වා ගෙන යාමේ වැදගත්කම ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- රටක සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම සහ පවත්වාගෙන යෑම සඳහා ශ්‍රම බලකායෙන් සිදු වන මෙහෙය වැදගත් වන බව
- ඒ අනුව කැපවීමෙන් යුතු ව තම රැකියාවට අදාළ සේවා සැපයීම කළ යුතු බව
- යහපත් ශ්‍රමිකයකු සතු විය යුතු ගුණාංග

උදාහරණ:-
- නියමිත වේලාවට පෙර සේවයට පැමිණීම/නියමිත කාලය තුළ සේවයේ නිරත වීම
- කැපවීම
- යුතුකම් හා වගකීම් ඉටු කිරිම
- සාමූහිකත්වය
- සහයෝගයෙන් කටයුතු කිරීම
- වෘත්තීය සංවර්ධනය සඳහා උනන්දු වීම
- නායකත්වයට ගරු කිරිම
- තෘප්තිමත් ව සේවයේ නිරත වීම
- ආයතනයේ නීතිරීති හා සම්ප්‍රදාය ගරු කිරීම

**ගුණාත්මක යෙදවුම්**

යහපත් කටයුතුවලට සිය ශ්‍රමය යොමු කර දියුණු වූ පුද්ගල චරිත පිළිබඳ තොරතුරු, විස්තර
සාර්ථකත්වයට පත් ප්‍රකට චරිතවල පැවති ගුණාංග ඇතුළත් ලේඛන
ශ්‍රම බලකායේ වැදගත්කම පිළිබඳ ව ලියවී ඇති පුවත්පත් සඟරා, ලිපි හා වාර්තා
සේවක ආචාර ධර්ම, ලැයිස්තු උදාහරණ:- ගුරු, වෛද්‍ය, අනිකුත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- රටක ශ්‍රම බලකායෙන් සිදු වන මෙහෙය පිළිබඳ ව බුද්ධිමණ්ඩල සාකච්ඡාවක් සංවිධානය කර සුදුසු නිර්ණායක ඇසුරින් ඇගයීමට ලක්කරන්න.
- යහපත් ශ්‍රමිකයකු සතු ගුණාංග යන මැයෙන් /පෝස්ටරයක්/ කවි පන්තියක් /දෙබසක් නිර්මාණය කරවා නිර්ණායක මූලික ව ඇගයීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.6 සේවා ස්ථානයේ අපේක්ෂා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රමිකයකු වශයෙන් සේවා ස්ථානයක අපේක්ෂා පිළිබඳ සංවේදී වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- සේවා ස්ථානයේ අපේක්ෂා ඉටු කිරීම සේවාදායකයාගේ යුතුකම හා වගකීම බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

සේවා ස්ථානයක අපේක්ෂා

- ඕනෑ ම සේවා ස්ථානයක සුවිශේෂී අපේක්ෂා පවතින බව නිදසුන් මඟින් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ශ්‍රමිකයකු වශයෙන් තම සේවා ස්ථානයේ අපේක්ෂා පිළිබඳ සංවේදී වීමේ අවශ්‍යතාව
- සේවා ස්ථානයේ අපේක්ෂා ඉටු කිරීම සේවාදායකයාගේ යුතුකම හා වගකීම ලෙස සැලකීමේ වැදගත්කම.
- ශ්‍රමිකයන් සේවා ස්ථානයක අපේක්ෂා සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කිරීම, සේවා ස්ථානයේ පැවැත්ම හා සංවර්ධනයට හේතු වන අයුරු පැහැදිලි කිරීම.
- සේවා ස්ථානයක අපේක්ෂාවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
  - බාහිර පෙනුම නිසි පරිදි පවත්වාගෙන යෑම
  - නියමිත වේලාවට සේවයට පැමිණීම
  - සේවාලාභීන් තෘප්තිමත් වන අන්දමින් සේවා සැපයීම
  - වේලාවට වැඩ කිරීම
  - සේවා ස්ථානයේ දියුණුවට කැපවීම
  - කාර්යක්ෂමතාව
  - උපරිම සේවාවක් සැපයීම
  - සේවා ස්ථානය සතු සම්පත් ආරක්ෂා කිරීම

  මෙම අපේක්ෂා ඉටු කිරීම සඳහා ශ්‍රමිකයන් කැපවීමේ අවශ්‍යතාව හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

ඵලදායී හා කාර්යක්ෂම සේවා ආයතනයක ස්වභාවය දැක්වෙන ඡායාරූප වීඩියෝ පට

විවිධ ආයතනවල ''දැක්ම'' හා ''මෙහෙවර '' ප්‍රකාශ

විවිධ ආයතනවලින් ප්‍රකාශයට පත්කර ඇති වෘත්තීය ආචාර ධර්ම ලේඛන

ඵලදායිතා සංකල්ප දැක්වෙන ලිපි ලේඛන

අවට ප්‍රදේශයේ සේවා ස්ථානයක අපේක්ෂා, සේවාදායකයන්ගේ යුතුකම් හා වගකීම් දැක්වෙන ලේඛන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- භූමිකා රංගන ඇසුරින් ඵලදායි හා ඵලදායි නොවන සේවා ආයතනවල ස්වභාවය නිරූපණය කරවීම. ඒ ඇසුරින් සුදුසු නිර්ණායක ඔස්සේ ඇගයීමට ලක් කරන්න.
- ඵලදායි සේවා ස්ථානයක තිබිය යුතු බාහිර පෙනුම දක්වෙන චිත්‍ර/ පෝස්ටර්/ ඡායාරූප/ ආකෘති යොදාගෙන කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් සංවිධානය කර සුදුසු නිර්ණායක ඇසුරින් ඇගයීමට ලක්කරන්න.
- සේවා ස්ථානයක අපේක්ෂා ඉටු කිරීම සඳහා සේවාදායකයාගේ යුතුකම් හා වගකීම් දක්වෙන සටහනක් නිර්මාණය කරවන්න. සුදුසු නිර්ණායක ඇසුරින් ඇගයීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.7 සේවක අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- සේවක අයිතිවාසිකම් හා යුතුකම් වගු ගත කරයි.
- සේවක අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සේවක අයිතිවාසිකම් සුරක්ෂිත වීම සේවකයන් තුළ රැකියා තෘප්තිය ඇති වීමට හා සේවා ඵලදායිතාව වර්ධනය වීමට හේතු වේ.
- එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම සේවා ස්ථානයේ දියුණුවට මෙන්ම නිෂ්පාදන ඵලදායීතාව ඉහළ යෑමට ද හේතු වේ.
- එමෙන්ම යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කරන සේවකයා ඇගයීමට ලක් වීම නිරන්තරයෙන් සිදුවේ.

අයිතිවාසිකම්:-
- ආරක්ෂිත, පිරිසිදු ප්‍රසන්න පරිසරයක සේවය කිරීම
- රැකියාවට අදාළ මෙවලම්
- කෑම විවේකය
- නිවාඩු (වරප්‍රසාදයක් ලෙස)
- මූල්‍ය ප්‍රතිලාභ (අසනීප නිවාඩු ඇතුළත් ව)
- මූලික පුහුණුව
- නිරන්තර වෘත්තීය සංවර්ධනය
- අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයට අවස්ථා
- වෘත්තීය සමිති සාමාජිකත්වය

යුතුකම්:-
- නියමිත වේලාවට සේවයට පැමිණීම
- සේවා අවශ්‍යතාවට අනුව රාජකාරි කිරීම
- පෞද්ගලික පෙනුම ප්‍රසන්න අයුරින් පවත්වාගෙන යෑම
- මහන්සියෙන් වැඩ කිරීම
- මනා විනයකින් හා ශික්ෂණයකින් යුක්ත වීම
- කණ්ඩායම් සාමාජිකයකු ලෙස සාර්ථක ව කටයුතු කිරීම
- සේවා ස්ථානයේ අපේක්ෂා හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම
- සේවා ස්ථානයේ පහසුකම්, සම්පත් හා මෙවලම් ආදියට ගරු කිරීම හා ආරක්ෂාව
- සේවා ස්ථානයේ දියුණුවට සාමූහිකත්වයෙන් යුතු ව කටයුතු කිරීම

**ගුණාත්මක යෙදවුම්**

සේවක අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ ලියැවී ඇති ලේඛන, පත්‍රිකා, පෝස්ටර්, චක්‍රලේඛන, අණපනත්, ආයතන සංග්‍රහයේ සරල නිදසුන් ගෙන දක්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සේවක අයිතිවාසිකම් පිළිබඳ ව සකස් කරන ලද ප්‍රශ්න කිහිපයක් ඇසුරින් ඇගයීම් කරන්න.
- සේවක යුතුකම් දැක්වෙන සංකල්ප සිතියමක් නිර්මාණය කර ඇගයීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.8 පෞද්ගලික වෘත්තීය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේ වැදගත්කම අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රමිකයකු වශයෙන් පෞද්ගලික කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- තමා සතු කුසලතා සහ තම අභිරුචින් පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශකයකු සමඟ සාකච්ඡා කරයි.
- වෘත්තීය සංවර්ධනය සඳහා විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ශ්‍රමිකයෙකු වශයෙන් පෞද්ගලික වෘත්තිය ගුණාංග ප්‍රගුණ කරගැනීමේ වැදගත්කම
  - පෞද්ගලික කාර්ය සාධනය
  - අධ්‍යාපන සුදුසුකම් ඉහළ නංවා ගැනීම
  - රැකියාවට අදාළ වෘත්තීය සුදුසුකම් සංවර්ධනය කර ගැනීම
  - නවීන තාක්ෂණය සමඟ කටයුතු කිරීමට අවශ්‍ය පුහුණු වීම් ලබා ගැනීම හා නවීන තාක්ෂණය භාවිතය
  - තම සේවා ආයතනයේ ඉලක්ක හඳුනා ගැනීම හා ඒවා ඉටු කර ගැනීමට කටයුතු කිරීම
  - සේවාලාභීන්ගේ අපේක්ෂා ඉටු කිරීම
  - නායකත්ව ගුණාංග හා පෞරුෂය ඉහළ නංවා ගැනීම
  - නිර්මාණකරණයට යොමු වීම
  - සාමූහික ව කටයුතු කිරීමට අවශ්‍ය මෘදු ගුණාංග කුසලතා සංවර්ධනය කර ගැනීම
- ඵලදායි ශ්‍රමිකයකු වශයෙන් තම කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීම නිසා අත්වන ප්‍රයෝජන

  උදාහරණ:-
  - නිෂ්පාදන ඵලදායිතාව ඉහළ යෑම
  - තම වෘත්තීය නිමවුම්වල ගුණාත්මක භාවය ඉහළ යෑම
  - සේව්‍ය, සේවක දෙපක්ෂය ම තෘප්තිමත් වීම
  - සේවාලාභීන්ට ගුණාත්මක සේවයක් ලැබීම
  - සේවා ස්ථානයේත් පොදුවේ රටේත් සංවර්ධනයට යහපත් දායකත්වයක් ලැබීම
- පෞද්ගලික වෘත්තිය ගුණාංග සංවර්ධනය කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග
  - තමා සතු කුසලතා හා අභිරුචි හඳුනා ගැනීම
  - තමන් සතු කුසලතා සංවර්ධනය සඳහා ඉලක්ක පිහිටුවා ගැනීම
  - ඒවා සංවර්ධනය කරගැනීමට උනන්දුවක් දැක්වීම

- වෘත්තීය ගුණාංග සංවර්ධනය කර ගැනීමට ප්‍රයෝජනවත් වන පුද්ගලයන් හා ආයතන හඳුනා ගෙන එම ආයතන හා පුද්ගලයන්ගේ සේවා ලබා ගැනීමට යොමු වීම
- වෘත්තීය ගුණාංග සංවර්ධනය කර ගැනීම සඳහා විවිධ අධ්‍යයන ක්‍රම භාවිතයට යොමු වීම
  - ★ ඉගෙනීම් ක්‍රම උදාහරණ:-
    - අත්දැකීම් හුවමාරුව
    - පාරම්පරික ක්‍රම ශිල්ප පවත්වා ගෙන යාම හා ඒවා වර්තමානයට ගැළපෙන ලෙස නවීකරණය
    - නවෝත්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම
    - විශේෂඥ අත්දැකීම් ලබා ගැනීම
    - නවීන තාක්ෂණය යොදා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

වෘත්තීය මාර්ගෝපදේශනය හා සම්බන්ධ ව ලියවී ඇති පොත්, සඟරා, පෝස්ටර්, සංයුක්ත තැටි ( CD ) පට, වීඩියෝ දර්ශන

නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය / තරුණ සේවා සභාව මඟින් ප්‍රකාශිත වෘත්තීය මාර්ගෝපදේශන පොත්, ලේඛන

පාරම්පරික ශිල්ප, වෘත්ති පිළිබඳ ව තොරතුරු ඇතුළත් ජනකලා කේන්ද්‍රය, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත ලේඛන

මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා යොදාගත් නව නිර්මාණ නිපයුම් පිළිබඳ තොරතුරු

අන්තර්ජාලය ඇසුරින් වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා මඟ පෙන්වීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ශ්‍රමිකයකු වශයෙන් පෞද්ගලික වෘත්තීය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව කතාවක් පැවැත්වීමට අවස්ථාව ලබාදී ඇගයීමට ලක්කිරීම.
- මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීමට යොදාගත් නව නිපයුම් පිළිබඳ ව තොරතුරු ඡායාරූප, නව නිපයුම්කරුවන් පිළිබඳ තොරතුරු පුවත්පත්, සඟරා, අන්තර්ජාලය ඇසුරින් අධ්‍යයනය කර පොත් පිංචක් සැකසීම. එම පැවරුම සුදුසු නිර්ණායක යොදා ඇගයීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.9 සේවාලාභීන් තෘප්තිමත් කළ හැකි විවිධ උපාය මාර්ග විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- සේවාලාභීන් තෘප්තිමත් කිරීමේ උපාය මාර්ග යෝජනා කරයි.
- සේවාලාභීන් මැනවින් හඳුනා ගෙන කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සේවාලාභීන් තෘප්තිමත් කිරීමේ වැදගත්කම
- සේවාලාභීන් තෘප්තිමත් කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග
  - සේවාලාභීන්ගේ අපේක්ෂා මැනවින් හඳුනා ගැනීම
  - සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් ගුණාත්මක තත්ත්වයෙන් උසස් සේවාවක් සැපයීම
  - සේවාලාභීන් සමග සුහද සබඳතා ගොඩනගා ගැනීම
  - තමන්ට/තම සේවා ස්ථානයට හුරු වූ සේවාලාභීන් අඛණ්ඩ ව රඳවා ගැනීමට උනන්දු වීම
- සේවාලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ

  උදාහරණ:- තම අපේක්ෂාවන් ඉටු වීම
  
  ගුණාත්මක සේවයක් ලැබීම

සේවාලාභීන් තෘප්තිමත් කිරීම නිසා අත්වන ප්‍රයෝජන

උදාහරණ:-
- ශ්‍රමිකයෙකු වශයෙන් තම කාර්යභාරය සේවාලාභීන්ගේ ඇගයීමට ලක් වීම.
- තමාගේ/ තම සේවා ආයතනයෙන් සේවය ලබා ගැනීමට ඔවුන් වැඩි කැමැත්තක් දැක්වීම
- තමන්ගෙන්/ තම සේවා ආයතනයේ කීර්ති නාමය ඉහළ මට්ටමකට පවත්වා ගෙන යාමට හැකිවීම
- ශ්‍රමිකයෙකු වශයෙන් සේවය සැපයීම මඟින් තෘප්තියක් ලැබීම
- හොඳ ආදායමක් ඉපයීමට මං පෙත් විවර වීම

**ගුණාත්මක යෙදවුම්**

අවට ප්‍රදේශයේ ඇති සේවා ආයතන කිහිපයක සේවාලාභීන් තෘප්තිමත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුවක්

සේවාලාභීන් තෘප්තිමත් කිරීමෙන් අත්වන ප්‍රතිලාභ ඇතුළත් ලැයිස්තුවක්

සේවාලාභීන් තම තෘප්තිමත්භාවය පිළිබඳ ව පළ කළ වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සේවාලාභීන් තෘප්තිමත් කිරීම මඟින් සේවා ආයතනයට අත්වන ප්‍රයෝජන කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් මඟින් ඇගයීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම**

8.6.10 ආදායම් ඉපයීම ජීවන රටාවට බලපාන ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01 යි**

**ඉගෙනුම් පල**

- ආදායම වැඩි කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි.
- තම ආදායම වැඩි කර ගැනීම සඳහා බුද්ධිමත් හා සමාජ හිතකාමී ව කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- හොඳ ආදායමක් ලැබීම ජීවන තත්ත්වයේ සංවර්ධනයට හේතු වන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- හොඳ ආදායමක් ලැබීම නිසා අත්වන ප්‍රයෝජන

  උදාහරණ:- - ආර්ථිකය ශක්තිමත් වීම
  - තම අවශ්‍යතා ඉටුකර ගැනීමේ හැකියාව වර්ධනය වීම
  - අනාගතය වෙනුවෙන් ඉතිරි කිරීමේ හැකියාව වර්ධනය වීම
  - යහපත් ජීවිතයක් ගත කිරිමට අවශ්‍ය ආර්ථික පසුබිම ගොඩ නැගීම
- අඩු ආදායම් ලැබීම නිසා අත්වන ප්‍රතිවිපාක

  උදාහරණ:- - දුර්වල ආර්ථික මට්ටම
  - තම අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව දුර්වල වීම
  - ජීවන මට්ටම පහළ යාම
  - ඉතිරි කිරීම් අඩු වීම
- සමාජ හිතකාමී ක්‍රියාමාර්ග ඔස්සේ ආදායම වැඩිකර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රමෝපාය හඳුනාගෙන, ඒවා ක්‍රියාවට නැංවීමේ වැදගත්කම

  උදාහරණ:- - වැඩ ලෝකයේ රැකියා ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
  - ඒ අනුව තමන් තෝරා ගැනීමට අපේක්ෂිත රැකියාවට අවශ්‍ය අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට උනන්දු වීම
  - තෝරාගත් රැකියාවෙහි තම හෘද සාක්ෂියට එකඟ ව නොපිරිහෙළා වැඩ කිරීම මඟින් හොඳ සේවාවක් සැපයීමට යොමු වීම
  - වෘත්තීය සංවර්ධනය සඳහා උනන්දු වීම
  - ස්වයං රැකියා සඳහා යොමු වීම

**ගුණාත්මක යෙදවුම්**

හොඳ ආදායමක් ලැබීම නිසා අත්වන ප්‍රයෝජන සහ අඩු ආදායමක් ලැබීම නිසා අත්වන ප්‍රතිවිපාක ඇතුළත් වගු සටහනක්

ආදායම වැඩි කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වගු සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- කණ්ඩායම් පැවරුම් හා වගු සටහන් නිරීක්ෂණය වැනි ක්‍රියාකාරකම් මඟින් අදාළ විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කරවන්න. ඉගෙනුම් පල සාධනය වීම පිළිබඳ නිර්ණායක මූලික කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශන ක්‍රියාකාරකම් 8.6

**නිපුණතාව** 8.6 • වැඩ ලෝකයට හුරු වෙයි.

**නිපුණතා මට්ටම** 8.6.1 • වැඩ ලෝකයේ විවිධත්වය අගය කරයි.

**ඉගෙනුම් පල** වැඩ ලෝකයේ විවිධත්වය පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - " වැඩ ලෝකය හඳුනා ගනිමු "

**කාලය** - මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** -
- ඇමුණුම 8.6.1
- ඇමුණුම 8.6.1.2

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I** -

- ඇමුණුම 8.6.1 පන්තියට ඉදිරිපත් කරමින් ක්‍රියාකාරකමට ප්‍රවේශ වන්න. තමන් දන්නා රැකියා කිහිපයක් නම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සමාජයේ ඇති විවිධ රැකියා සහ රැකියා ක්ෂේත්‍ර සියල්ලේ එකතුව "වැඩ ලෝකය" බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 05)

**පියවර II**-

- පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 8.6.1.2 කාර්ය පත්‍රිකාව බැගින් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- අවශ්‍ය පමණට කාලය ලබා දෙන්න.

(මිනිත්තු 20)

**පියවර III**

- කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සියලු ම කණ්ඩායම්වලට අදහස් දැක්වීමට උපදෙස් දෙන්න.
- අපේක්ෂිත කරුණු මතු වන අයුරින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15)

**පහත දැක්වෙන නිර්ණායක මත ඇගයීම් හා තක්සේරුකරණය සිදු කරන්න**

1 වැඩ ලෝකය යන්න හඳුන්වයි.
2 වැඩ ලෝකයේ පවතින රැකියා ක්ෂේත්‍ර නම් කරයි.
3 විවිධ ක්ෂේත්‍ර යටතේ පවත්නා රැකියා වගු සටහනක දක්වයි.
4 තමා ද වැඩ ලෝකයට සූදානම් වන්නෙකු බව පිළිගනිමින් අදහස් ඉදිරිපත් කරයි.
5 සාමූහික ව ක්‍රියාකාරකමේ නිරත වෙයි.

ඇමුණුම 8.6.1

බ්‍රිස්ල් බෝඩයක ලියන ලද රැකියා ලැයිස්තුව (ගුරුවරයාට අවශ්‍ය ප්‍රමාණයට රැකියා යොදන්න)

- ගුරුවරයා
- වෛද්‍යවරයා
- ගොවියා
- කම්කරුවා
- හෙද නිලධාරියා
- පොලිස් නිලධාරියා
- රංගන ශිල්පියා
- ගායකයා
- මෘදුකාංග ඉංජිනේරුවරයා
- රූපලාවණ්‍ය ශිල්පියා
- ධීවරයා

ඇමුණුම 8.6.1

**කාර්ය පත්‍රිකාව** **1 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අයත් රැකියා ලැයිස්තුවක් සකස් කිරීම යි.

1............................ 2 ............................ 3 ............................ 4............................ 5...........................

6 ............................7............................ 8 ............................ 9............................10 ..........................

**කාර්ය පත්‍රිකාව** **2 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ කාර්මික ක්ෂේත්‍රයට අයත් රැකියා ලැයිස්තුවක් සකස් කිරීම යි.

1............................ 2 ............................ 3 ............................ 4............................ 5...........................

6 ............................7............................ 8 ............................ 9............................10 ..........................

**කාර්ය පත්‍රිකාව** **3 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යය වන්නේ සේවා ක්ෂේත්‍රයට අයත් රැකියා ලැයිස්තුවක් සකස් කිරීම යි.

1............................ 2 ............................ 3 ............................ 4............................ 5...........................

6 ............................7............................ 8 ............................ 9............................10 ..........................